# නියමුවා

"එනයින් සමාජය වෙනස්වීමේ දේශපාලන විප්ලවයන් හටගැනීමේ අවසාන හේතුව සෙවිය යුත්තේ මිනිසුන්ගේ මොළ තුළ නොව, එසේත් නැතහොත් සදාකාලික සත්‍යය සහ සාධාරණත්වය ගැන මිනිසුන් ලබන වඩාත් වැඩි වන අවබෝධය තුළ නොව, නිෂ්පාදන ක්‍රමයේ සහ හුවමාරුවේ වෙනස්වීම් තුළය. ඒවා සෙවිය යුත්තේ දර්ශනවාදයෙහි නොව ඒ ඒ යුගයට අනුරූප වන ආර්ථිකයෙහිය."

එංගල්ස්

සමාජවාදය මනෝරාජ්‍යයෙන් විද්‍යාව දක්වා, 31-32 පිටු

ISSN 1391 - 1031 | 2022 දෙසැම්බර් | 27 වෙළුම | 07 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=



ගාල්ල සමනල ක්‍රීඩාංගණය...
2022 දෙසැම්බර් 01




# මීළඟ ආණ්ඩුව පිහිටුවන්නේ ජාතික ජන බලවේගයයි

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

ජාතික ජන බලවේගයට අවශ්‍ය වන්නේ ඇමතිකම් බෙදා ගන්නා ආණ්ඩුවක් නොව ඇද වට්ටවා ඇති අගාධයෙන් රට ගොඩගත හැකි ආණ්ඩුවක් බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, එළඹෙන පළාත් පාලන මැතිවරණයෙන් පසුව නිසැක ලෙසම මහ මැතිවරණයක් කැඳවීමට රනිල් රාජපක්ෂ ආණ්ඩුවට සිදු වන බවත් එම මහ මැතිවරණයෙන් රට වෙනස් කරන නව ජවයක් සහිත අලුත් ආණ්ඩුවක් පිහිටුවීමට ජාතික ජන බලවේගය සූදානම් බවත් අවධාරණය කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ දෙසැම්බර් 01වැනි දින ජාතික ජන බලවේගය විසින් ගාල්ල නගරයේ සංවිධානය කරන ලද 'රට විකුණන, ජනතාව මර්දනය කරන ජන පීඩක ආණ්ඩුවට එරෙහි ජනබල විරෝධය' අවසානයේ පැවති රැලිය අමතමිනි. මෙම විරෝධතා රැලියේදී ඔහු මෙසේද පැවසීය.

"ඇත්ත ජනතාවගේ ආණ්ඩුවක් හදන, රට ගොඩගත යුතු යුගයක ජනතාවගේ බලාපොරොත්තු දල්වන එකම ව්‍යාපාරය හැටියට ජාතික ජන බලවේගය ඉදිරියට එමින් තිබෙනවා. රනිල් වික්‍රමසිංහලා අතීතයේ ජීවත්වෙන අතර අපි යහපත් අනාගතයක් වෙනුවෙන් මහන්සි වී ක්‍රියාකරනවා. නුදුරේදීම ඒ මහන්සිය මල්ඵල ගන්නා බව ඉතාම පැහැදිලියි. රනිල් වික්‍රමසිංහ හමුදාව, පොලීසිය ගැන විශ්වාස කරන අතර, අපි මහජනතාව ගැන විශ්වාසයක ඉන්නවා. මේ රටේ පීඩාවට පත්වූ ජනතාවක් නැගී සිටින වෙලාවට හදිසි නීතිය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වගේ කිසිවක් අදාළ වෙන්නේ නැහැ. හමුදාව, පොලීසිය කියන්නේ මේ රටේ පුරවැසියන්ගේ දරුවෝ ඉන්න තැනක්. ජනතාවගේ ප්‍රශ්න ඒගොල්ලන්ටත් අදාළයි. රනිල් වික්‍රමසිංහගේ අන්තිම මොහොතේ පොලීසිය, හමුදාව ඇවිත් බේරා ගනියි කියා හිතනවා නම්, එය කවදාවත් වෙන්නේ නැහැ. අවසාන මොහොතේදී හමුදාව පොලීසියත් පලා යන පාලකයන්ගේ පැත්ත වෙනුවට ජනතාවගේ පැත්ත ගන්නා බව ලෝකයෙන් ඉගෙන ගන්න කියලා රනිල් වික්‍රමසිංහට කියනවා. ජනතාවගේ ආණ්ඩුවක් හදන්න ජනතාවගේ සහයෝගය ඕනෑ. අපට ඕනෑ ආණ්ඩුවක් හදන්න විතර නම්, දැන් පවා පාර්ලිමේන්තුව තුළ ආණ්ඩුවක් අටවා ගන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ නන්නත්තාර වූ පිරිසක් එකතු කර ගන්න පුළුවන්. එහෙම ආණ්ඩුවකින් වැඩක් නැහැ.

රනිල් වික්‍රමසිංහලාට ජනතාව බියවද්දන්න, **02 වැනි පිටුවට**


**03 අරගලයෙන් කිසිවක්...**


රනිල් - රාජපක්ෂ පාලනය දැන් උත්සාහ කරන්නේ ජනතා නැගිටීම් ඇතිවීමට බලපාන හේතු නැතිකිරීමට නොව බියවැද්දීම් මගින් ජනතා අරගල නැවැත්වීමටය. එය ලොව කිසිදු තැනක සාර්ථක වූ ක්‍රියාමාර්ගයක් නොවන බව...





**05 බුද්ධි ගලනයේ...**

උගතුන් හා ඒ ඒ ක්ෂේත්‍රවල වෘත්තිකයින් රට හැරයාම තවදුරටත් එම ක්ෂේත්‍රයන් ආගාධයකට ඇද දැමීමට හේතු වේ. ප්‍රධාන වශයෙන්ම ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ වෘත්තිකයින්ගේ, ප්‍රවීණත්වය, දක්ෂයන්ගේ දායකත්වය නොලැබී යාම නිසා...


**09 සංස්කෘතිය සිරගෙයක්ද?...**

මේ වන විට 'ඇඳුම' විලිවසා ගැනීමේ, ශරීරය බාහිර පරිසර තත්වයන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ සීමාවෙන් ඔබ්බට ගිය සංස්කෘතික දෙයක් බවටද පත්ව තිබේ. විවිධ ඇඳුම් වර්ග, විවිධ විලාසිතා, විවිධ වර්ණ ආදිය විසින් තහවුරු කරන්නේ...





තරුණ.................................... 04
ජාත්‍යන්තර.......................... 06
ආ.ර්ථිකය ............................ 07
කාන්තා.................................. 08
විශේෂාංග.............................. 10
වේදිකාව................................11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# විදුලි සේවක සංගමයේ ජාතික සමුළුව මහරගමදී මුළුදෙයි



ලංවිම ඇතුළු ජාතික සම්පත් විකිණීමට, සේවක රැකියා අනතුරේ හෙළීමට එරෙහිව ලංවිම ගොඩනගන ජනතා බලයක් උදෙසා විදුලි සේවකයින් පෙළගස්වන ලංකා විදුලි සේවක සංගමයේ ජාතික සමුළුව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා මහරගම තරුණ සේවා සභා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම් රංජන් ජයලාල් සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ හා රට පුරා සිටින විදුලි සේවක සංගම් සාමාජිකයෝ දහස්ගණනක් මෙම සමුළුව සඳහා සහභාගි වූහ.

# සංස්ථාව සුරැකීමට බලකරමින් ඉංජිනේරු සංස්ථා සේවකයෝ උද්ඝෝෂණයේ



නියමිත දිනට වැටුප ලබාගැනීම, ඉංජිනේරු සංස්ථා සේවක රැකියා සුරක්ෂිත කර ගැනීම ඇතුළු කරුණු ගණනාවක් මුල්කරගෙන පසුගිය 22දා ඉංජිනේරු සංස්ථා සේවකයෝ කොළඹ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂණයක නිරත වූහ. මෙහිදී ඉංජිනේරු සංස්ථාව සුරැකීමේ එකමුතුව වෙනුවෙන් අදහස් දැක්වූ මංජුල සිරිසෝම සහෝදරයා කියා සිටියේ මේ දෙසැම්බර් 31 දිනෙන් පසු ඉංජිනේරු සංස්ථාව අවසන් කිරීමේ කටයුතු ආණ්ඩුව විසින් සිදුකිරීමට කටයුතු කරමින් සිටින බවත් ඊට එරෙහිව සියලු සේවකයින් පෙළගස්වමින් එය පරාජය කිරීමට සූදානම් බවය.

# වරාය සමුපකාර බැංකුවේ ජවිපෙ නියෝජිතයින් නැවතත් බලයට



වරාය සමුපකාර බැංකුවට මහ සභා නියෝජිතයන් 77 දෙනෙකු තෝරා පත්කරගැනීම සඳහා පසුගිය 23වැනි දින පැවති නිලවරණයට සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය නියෝජනය කරමින් ඉදිරිපත් වූ අපේක්ෂයෝ 77 දෙනාම සමුපකාර බැංකුවේ ඉදිරි වසර 03 සඳහා මහ සභා නියෝජිතයන් ලෙස නිතරගයෙන් තේරී පත්ව සිටිති. සමුපකාර බැංකු නිලවරණය සඳහා මෙවරත් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන වෘත්තීය සමිතිය ඉදිරිපත් කරන ලද කණ්ඩායම නිතරග ජයග්‍රහණයක් ලබා ඇත්තේ අනෙකුත් දේශපාලන පක්ෂ සම්බන්ධ වෘත්තීය සමිති හෝ ස්වාධීන කිසිවකුත් අදාළ නිලවරණයට ඉදිරිපත් වී නැති තත්වය තුළය.

වරාය සමුපකාර බැංකුවට මහ සභා නියෝජිතයන් තෝරා පත්කරගැනීම සඳහා අවසන් වරට ඡන්දයක් පවත්වා ඇත්තේ 2010 වර්ෂයේ වන අතර ගෙවුණු වසර 12 තුළ සිව් වතාවක් නිලවරණ පවත්වා ඇතත් ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ නියෝජිතයන් හැර වෙනත් කිසිදු දේශපාලන පක්ෂයක් නාම යෝජනා බාරදීමට පවා කටයුතු කර නැත. සමුපකාර බැංකුවේ වර්තමාන සමාජික සංඛ්‍යාව 8000ක් වන අතර සමුපකාර බැංකුව සතු වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 460කි.

"සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය වරාය සමුපකාර බැංකුවට සම්බන්ධ වෙන්නෙ 2000 අවුරුද්දේ විතර. 2010 වසරේ දී තිබ්බ අපිට එරෙහිව නිලවරණයට ඉදිරිපත්වුණු එවකට ආණ්ඩුවේ බලය තිබුණු කට්ටිය අන්ත පරාජයට ලක්වුණා. එදා ඉදල අද වෙනකම් නිලවරණ හතරක් තියල තියෙනවා. හැබැයි අපිට එරෙහිව කිසිම කණ්ඩායමක් තරග කරන්න එන්නේ නැහැ. ඒ හින්දා ජන්දයක් නෑ. ඒ තමයි ජාතියේ හදවත කියන විවිධ දේශපාලන පක්ෂ නියෝජිතයන් ඉන්න වරාය ඇතුලේ ජවිපෙ අපිට තියෙන පිළිගැනීම. වරායේ සමුපකාරයේ අපිට බලය දුන්නේ එක පාරයි. අපි ඒක කරලා පෙන්නුවා. ඊට පස්සේ කවුරුවත් අපිව පරාජය කරන්න ආවේ නැහැ. අපි දිගටම දිනනවා. ඒ නිතරගයෙන්. ඒ වගේම අපි වරාය සමුපකාරයත් දිනවනවා. ඒ තමයි ජවිපෙ අපේ ආදර්ශය" යයි මේ ජයග්‍රහණය පිළිබඳව අදහස් දක්වමින් සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ප්‍රධාන ලේකම් නිරෝශන් ගොරකානගේ සහෝදරයා නියමුවා වෙත පැවසීය.

# අයවැයට එරෙහිව ජනතාව දැනුවත් කෙරේ



ජනතාවට සහන නැති, බදු බර වැඩිකළ, රාජ්‍ය දේපළ විකුණන අයවැයට එරෙහිව ජනතාව දැනුවත් කරමින් අත්පත්‍රිකා බෙදා හැරීමේ ක්‍රියාමාර්ගයක් වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ඒකාබද්ධ ජනතා ව්‍යාපාරය මගින් පසුගියදා කොළඹදී ආරම්භ කරන ලදී. මෙම අවස්ථාව සඳහා වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ සමකැඳවුම්කරුවන් වන වසන්ත සමරසිංහ, උදේනි දිසානායක ඇතුළු වෘත්තීය සමිති නායකයෝ හා නියෝජිතයෝ සහභාගි වූහ. මේ වන විට කොළඹ ඇතුළු රට පුරා නගරයන්හි හා වැඩබිම්වල මෙම අත්පත්‍රිකා බෙදා හැරීමේ කටයුතු සිදුවෙමින් තිබේ.

'බදුබර අහසට! අයවැය කාටද?'
ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලය විසින්
2022.11.17 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වූ සම්මන්ත්‍රණය

## ලෙඩා ගොඩ ගන්න නම් ශක්තිමත් ආහාර ඕනෑ

ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලයේ සාමාජික
මහාචාර්ය ජනක් කුමාරසිංහ




1948 ආසියාවේ ප්‍රබලම ආර්ථිකයකට හිමිකම් කියපු අපි ඒක පුද්ගල ආදායම ජපානයට වඩා එක ඩොලරයක් පිටුපසින් හිටපු අපි අද ආසියාවට විතරක් නෙවෙයි මුළු ලෝකයටම ප්‍රශ්නයක් වුණු ආර්ථිකයක් බවට පත්වෙලා. 1948 ඉදලා මේ වෙනකල් ඉදිරිපත් කළ අයවැය කියවලා බැලුවොත් ඔබ ලංකාව ගැන හරි හැටි නොදන්න කෙනෙක් නම් ඔබ හිතන්නේ මේක කේතුමතී රාජ්‍යයක් කියලා. එතරම් ලස්සන යෝජනා අදහස් අයවැය වාර්තාවල තිබුණා. අපිට අද ඕනෑ ලස්සන අදහස් පිරුණු අයවැය පොත් පිංචක් නෙවෙයි.

අද අපේ රටේ ප්‍රධාන ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් තමයි නිෂ්පාදනය බිඳවැටෙමින් යෑම. අනෙක් කාර්ණය ඩොලර් හිඟකම. ඒ ඔස්සේ උද්ධමනය වැඩිවෙමින් යනවා. තවත් කරුණු ගණනාවක් සිදුවෙමින් යනවා. අපේ විදේශ සංචිත ඍණ වෙලා. මේ අයවැයෙන් මේවට උත්තර තියෙනවද? අපිට පේන්න තියෙන්නේ සාම්ප්‍රදායිකව ආපු ගමනම ඉදිරියට යෑමක්. තවත් වසරක් ඉදිරියට යන්න මුදල් ටිකක් හොයාගන්න මොනවා හරි කිරීමක් විතරයි දකින්න තියෙන්නේ. ඒකට තමයි රාජ්‍ය ආයතන ටිකක් විකුණන්න හදන්නේ වෙන වෙන වචන දාලා.

මහ බැංකුවෙන් බලාපොරොත්තු වෙනවා අවශ්‍ය බිම සකස් කරලා දීම. ස්ථාවර මිලක්. ස්ථාවර උද්ධමනයක් සහිත ආයෝජකයෙකුට විශ්වාසයක් තැබිය හැකි බිමක් විය යුතුයි. මහ බැංකුව ලස්සන පිටියක් හදල දෙන්න ඕනෑ මැච් එක ගහන්න. අයවැයකින් කරන්න ඕනෑ එහෙම දැක්මක් සහිතව රට සංවර්ධනය කිරීම. එහෙම දැක්මක් මේ අයවැයේ තියෙනවද? උදාහරණයකට ගන්න මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කරන්න රුපියල් මිලියන 100ක් වැය කරනවාලු. නිකන් ඔබ හිතල බලන්න අපේ රටේ වැව් කීයක් තිබෙනවාද? වැව් ගණනින් බෙදල බැලුවම ඔබට තේරෙයි මේ යෝජනාවල තරම. බෙල්ල මිරිකලා හරි බදු ටික ගන්න මිසක් ආර්ථිකය හැරවුමකට ගන්න යෝජනා නැහැ. උණක් හැදුණම පත්තියන් ආහාර කෑවට උණෙන් ගොඩ එන්න ශක්තිමත් ආහාර ලෙඩාට දෙන්න වෙනවා. එහෙම එකක් මේ අයවැයේ නැහැ. අපිට සතුටක් නැහැ අපේ දැනුමෙන් මේ රටට වැඩක් කරන්න අවස්ථාවක් නැහැ. නමුත් මේ වගේ වේදිකාවක අපේ දැනුම බෙදාගන්න ලැබීම එක්තරා දුරකට සතුටක්.

## හොර දොස්තරලා ලෙඩා මරන්නයි හදන්නේ

ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලයේ සාමාජික
මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු

ඔබ මේ වනවිටත් දන්නවා අපේ රට පාලනය කරන්නේ අයවැය හදන්නේ ඉතාම දූෂිත කණ්ඩායමක් කියලා. ඔවුන් මේ අයවැය සකස් කරන්නේ දූෂිත ක්‍රමය පවත්වාගෙන යන්න මිසක් ආර්ථිකය දියුණු කරන්න නෙවෙයි. මේ අයවැය කාටද? කෝටි දෙකක් වෙනුවෙන් මේ අයවැය යෝජනා හදන්නේ ඉතාම සුළු කණ්ඩායමක්. ඒ නිසා ලැබැඳියාවන්ගේ ගැටුමක් එනවා. දූෂිත කණ්ඩායමක් ඒ තීන්දු තීරණ ගන්න විට මේ ලබැඳියාවේ ප්‍රශ්නය දෙගුණ තෙගුණ වෙනවා. ඒ නිසා මේ අයවැය ගත්තොත් හුදෙක් ජනතාව වෙනුවෙන් නොව ආණ්ඩු බලය පවත්වාගෙන යෑම අරමුණෙන්ම සකස් කරන ලද අයවැයක්.

මේ සංඛ්‍යා ලේඛනවල තිබෙන දේවල් යථාර්ථයක් වෙන්නේ නැහැ. ආර්ථිකය එන්න එන්නම හැකිළෙනවා. රුපියල් ට්‍රිලියන 5කට ආසන්න ප්‍රමාණයක් ණය ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ මගින් තවදුරටත් සිදුවෙන්නේ ණය උගුලේ හිරවීමයි. ඒ නිසා බදු වැඩි කිරීම අනිවාර්යයක්. අනෙක් තමයි දිගුකාලීන සැලැස්මක් නැති ආණ්ඩුව කෙටිකාලීනව කරන එකම දේ විකිණීම. ඒ නිසා තමයි ලාබ ලබන රාජ්‍ය ව්‍යාපාර පවා විකුණන්න හදන්නේ. විකුණලා ගන්න සල්ලිවලින් රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යූගතකරනවා කරලා ආර්ථිකය දියුණු කරන බවක් කියනවද නැහැ. කරන්න යන්නේ විදෙස් සංචිත වැඩිකිරීමයි. ඒක අයිඑම්එෆ් කොන්දේසියක්.

ඉදිරි වසර 10 ඇතුළත විදේශ ආයෝජන වසරකට බිලියන 03 ගණනේ වැඩි කරනවලු. එහෙම බැලුවම වසර 10ට බිලියන 30ක් වෙනවා. නමුත් පැරණි සංඛ්‍යා ලේඛන බැලුවම වසර 40කට විදේශ ආයෝජන තිබෙන්නේ ඩොලර් බිලියන 13යි. ඒ නිසා පැහැදිලියි කොයිතරම් විකෘති සංඛ්‍යා ලේඛනද මේ තියෙන්නේ කියලා. ජනතාව රවට්ටන ඒවා එක පැත්තක තියෙනවා. අයිඑම්එෆ් එකට අවශ්‍ය සංඛ්‍යා ලේඛන වෙනම තියෙනවා. නමුත් හොඳට මතක තබාගන්න අයිඑම්එෆ් එකෙන් ඩොලර් බිලියන 2.9 දුන්නත් මේ වැඩේ ගොඩ දාන්න බැහැ. ඩිජිටල් ආර්ථිකයක් ගැන කියනවා. නමුත් 2019 ආණ්ඩුව මීටත් වඩා ඩිජිටල් ආර්ථිකයක් ගැන කතා කළා. නමුත් මේවා හරයෙන් තොර කතන්දර පමණයි. අපි ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලය විදියට අපි ජනතාව දැනුවත් කරන්න ඉදිරිපත් වුනේ. මේ අය අපිට පෙන්වනවා මේ ලෙඩා ගොඩගන්න යන්නේ රටම ශල්‍යාගාරයක් වගේ කියලා. නමුත් අපි කියනවා මේ ඉන්නේ හොර දොස්තරලා කණ්ඩායමක් ජනතාවගේ අතපය ගලවන වදකාගාරයක් මේක. ලෙඩා බේරෙන්නේ නැහැ. ලෙඩා මැරෙනවා. ඒකෙන් බේරගන්න අපි මැදිහත් වෙනවා.

## මේක ලෙඩා මළත් බඩ සුද්දයි අයවැයක්

ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලයේ සාමාජික
සුනිල් හඳුන්නෙත්ති

74 වසරක සාපයට වගකිය යුත්තෙක් වන රනිල් වික්‍රමසිංහ විසින්ම මේ අයවැය ඉදිරිපත් කිරීම එක්තරා ආකාරයක සරදමක්. රනිල් අයවැය කතාවේ මුල් පිටුවේ කියනවා නිදහසින් පසු 75වැනි වසර ගෙවන අපේ රට පත්ව ඇති තත්වය ගැන අපට සෑහීමකට පත්වෙන්න පුළුවන්ද? 11 වැනි පිටුවට

## මීළඟ ආණ්ඩුව පිහිටුවන්නේ...

01 පිටුවෙන්

විහිළු කරන්න, අවලාද නගන්න ඉඩ හැරලා අපි ජනතාව ඒකරාශී කරනවා. ආණ්ඩුව පිහිටුවන බලයක් වගේම රට ගොඩනගන්න කැපවෙන ජනතාවක් සංවිධානය කරන්නත් ඕනෑ. මහා මැතිවරණය අපට ටෙස්ට් මැච් එකක් නම් පළාත් පාලන මැතිවරණය වන්ඩේ මැච් එකක් වගේ වෙයි. පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ රනිල්ට අනිවාර්යයෙන්ම මහා මැතිවරණය කැඳවන්න වෙනවා. ඒ මහා මැතිවරණයෙන් අපේ රට වෙනස් කරන අලුත් ජවයක් සහිත අලුත් ආණ්ඩුවක් අපි පිහිටුවනවා. ඒ වෙනුවෙන් අපි සැමදෙනාටම ලොකු කාර්යභාරයක් තිබෙනවා. කිසිකෙනෙකුට පරද්දන්න බැරි දැවැන්ත දේශපාලන බලයක් අපි ගොඩනගමු. රනිල් රාජපක්ෂ පාලනයට අවසන් තිත තියලා අපේ දරුවන්ට යහපත් හෙටක් තිබෙන, අපිට මිනිස්සු වගේ ජීවත් විය හැකි හෙටක් තියෙන රටක් හදමු. ඒ වෙනුවෙන් අපේ දෑත්වලින් අපේ මහන්සියෙන් රට ගොඩනගන්න හැමෝම එකතු වෙමු."

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# හිට්ලර්, ඩින්ඩියම් හා රනිල්

පසුගිය නොවැම්බර් 23දා පාර්ලිමේන්තුවේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් කරනු ලැබූ කථාව කාගේත් විරෝධයට, ප්‍රහාරයට හා හාස්‍යයටද ලක්වූ ප්‍රකාශයක් විය.

ඔහු පැවසුවේ සමහරු ඔහු ඒකාධිපතියෙකු ලෙස හැඳින්වුවද ඔහු හිට්ලර් කෙනෙක් නොවන බවත් අරගලවලින් ආණ්ඩු පෙරළීමට මින්පසු ඉඩ නොදෙන බවත් අරගල කරන අය බලපත්‍ර ලබාගෙන අරගල කළ යුතු බවත්, අරගල කරන අයට අවශ්‍ය වූයේ ඩින්ඩියම් පාලනයක් ගොඩනැගීමට බවත්ය.

රනිල් වික්‍රමසිංහ විටින් විට පවසන බොහෝ දේ කරුණු නොදැන පවසන බවත්, ඔහු බොහෝවිට හැසිරෙන්නේ විහිළුකාරයෙකු ලෙස බවත් ඇත්තය. එහෙත් ජනාධිපති රනිල්ගේ මෙම ප්‍රකාශය සරලව බැහැර කිරීම නොකළ යුතුය. ඒ, මේ වන විට රනිල් වික්‍රමසිංහලා, රාජපක්ෂලා නියෝජනය කරන පාලක පංතියත් ඔවුන්ගේ ප්‍රභූ පැලැන්තියත් මුහුණ දී ඇති අභියෝගය ඉතාම බරපතළ හා තීරණාත්මක නිසාය.

ලංකාවේ ධනවාදය දැන් බරපතළම අර්බුදයකය. එයට දැන් ධනේශ්වර ක්‍රමය තුළ විසඳුම් නැත. දැන් අපේ රට මුහුණ දී තිබෙන අතිශය විනාශකාරී අර්බුදයන්ට තාවකාලිකව හෝ විසඳුම් ලබාදී ජනතා විරෝධයන් සමනය කර මටසිලිටි ලෙස වත්මන් ක්‍රමය පවත්වාගෙන යා හැකිනම් රනිල්ලා කරන්නේ එයය. එවිට ඔවුන්ට බොරු ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී වෙස්මුහුණකින්ම පාලනය ගෙන යා හැක. එහෙත් යථාර්ථය පවතින්නේ ඊට පරස්පරවය.

දැන් පාලක කල්ලිවලට පැරණි ආකාරයෙන් බලය පවත්වාගෙන යා නොහැක. ඔවුන් විසින්ම දශක 07ක් තිස්සේ නිර්මාණය කළ, විශේෂයෙන් පසුගිය දශක 04කට වැඩි කාලයක් තිස්සේ උග්‍ර තත්වයට පත්කළ සමාජ ආර්ථික අර්බුදය හමුවේ ජනතාව පීඩාවටත් කෝපයටත් පත්ව සිටී. තමන් මුහුණ දෙන දරාගත නොහැකි පීඩාවත් අපේක්ෂාභංගත්වයත් නිසා පොදු ජනයා දැන් අලුතින් සිතන්නට පටන්ගෙන තිබේ. ඔව්හු වසර 75ක දේශපාලන ගමන්මගේ ගැඹුරු වෙනසක් ඉල්ලා සිටිති. පසුගිය මාස 06කට වැඩි කාලය තුළ මහජන නැගිටීමක් දක්වා වර්ධනය වූ ජනතා අරගලයේ පත්ලේ තිබුණේද එයමය.

මෙරට ජනතාවෝ වීදි බැස ජනාධිපතිවරයෙක් රටින් පළවා හැරීමට සමත් වූහ. රනිල් වික්‍රමසිංහට ජනවරමකින් තොරව පිං ජනාධිපති ධුරය ලැබුණේද ඒ නිසාය. රාජපක්ෂ පාලනයට එරෙහිව එල්ල වූ විරෝධය කොතරම් බරපතළද යත් ඔවුන්ට පාලනයේ වගකීම්වලින් ඉවත්වී රනිල්ට සුක්කානම බාරදීමට සිදුවිය. දැන් අහම්බයකින් ජනාධිපති වූ රනිල් ඊළඟ ජනතා විරෝධතා රැල්ලක් පිළිබඳ බියෙන් පසුවීම ඉතාම තර්කානුකූලය. ඔහුගේ මේ සියලු ප්‍රකාශ එම 'සාධාරණ බිය' පදනම් කරගත් ඒවාය.

දැන් තිබෙන්නේ තවදුරටත් පුද්ගලයෙකුට බලය අහිමි වීමක සීමාව තුළ පවතින ජනතා පෙළගැස්මත් නොවන බව රනිල්ලා දනී. පුද්ගලයින් ලෙස ටික කලකට බලය නැතිව සිටීමට ඔවුන් සූදානම්ය. පසුගිය තට්ටුමාරු දේශපාලනය තුළ සිදුවූයේ එයයි. එහෙත් දැන් සම්ප්‍රදායික ධනේශ්වර බල කඳවුර අත්හරිමින් ජනයා ඉන් ඉවත්වීමට පටන්ගෙන තිබේ. එසේම එම ජනයා ඉතිහාසයේ පළමුවරට පාලන බලය තමන් වෙතට ගැනීම අරමුණු කරගෙන වමේ ප්‍රගතිශීලී මහජන ව්‍යාපාරයක් ගොඩනඟමින් ඒ හා අත්වැල් බැඳගනිමින්ද සිටී. ජාතික ජන බලවේගය වෙත ජනයා විශාල ලෙස ආකර්ෂණය වීම ඊට උදාහරණයකි.

දැන් රනිල් බියවී ඇත්තේ පුද්ගලයෙක් ලෙස තමන්ට ලැබුණ ජනාධිපති බලය නැතිවීමටත් වඩා, බලය තම පංතිය අතින් ගිලිහෙමින් පවතින නිසාය. නව ජනතා පාලනයක පෙර නිමිති පහළ වෙමින් තිබෙන නිසාය. එවිට බියට පත්වන රනිල් මෙලෙස හැසිරීම පුදුමයක් නොවේ.

කෙසේ වෙතත් රනිල්ට හිට්ලර් කෙනෙක් වීමට අවශ්‍ය වුවත් ඊට පණ පෙවීමට ඔහුට නොහැකි බව ඉතා පැහැදිලිය. ඒ, ඔහු සතුව රට තුළ කිසිදු ජන පදනමක් හා ජන බලයක් නොමැති නිසාය. එහෙත් ඩින්ඩියම් පන්නයේ පාලනයක් ඇති වෙන්නට නොදෙන බව කියමින් රනිල් ඩින්ඩියම්ට ඇඳීමට සූදානම් වන්නේදැයි ඔහුගේ ප්‍රකාශ දෙස බලන විට පෙනේ.

ඩින්ඩියම් යනු 1963 තෙක් දකුණු වියට්නාමයේ සිටි එක්සත් ජනපද ගැති රූකඩ පාලකයාය. බෞද්ධ විරෝධියෙක් හා වියරු මනසක් තිබුණු ඔහු දකුණු වියට්නාමය තුළ ගෙනගිය මර්දනකාරිත්වයත් ඊට එරෙහිව නැගුණු දැවැන්ත ජනතා විරෝධයත් නිසා අවසානයේ එක්සත් ජනපදය මැදිහත්වී හමුදා කුමන්ත්‍රණයකින් ඔහුව බලයෙන් පහකර මරා දමන ලදී. ඔහුගේ මිනිය හමුවූයේ කාණුවක තිබියදීය. 1975තෙක් දකුණු වියට්නාමය පාලනය කළ නුයෙන් වෑන්තියූ බලයට ආවේ ඉන්පසුවය. අවසානයේ දකුණු වියට්නාමයේ විප්ලවය ජය ගැනීමත් සමග ඔහුද රටින් පලා ගියේය.

ඒ නිසා ඩින්ඩියම්, හිට්ලර්, මාකෝස්, බැටිස්ටා, ඉඩි අමීන් ඇතුළු සියලු ඒකාධිපතියන්ගේ ඉරණම සමාන එකක් බව රනිල් වික්‍රමසිංහලා තේරුම් ගත යුතුය. මන්ද තම අනාගත ඉරණමේ අයිතිය තමන් අතට ගැනීමට ජනතාවක් අදිටන් කරගත් විට සියලු ඒකාධිපතීන්ට හිමිවන්නේ ඉතිහාසයේ කුණු බක්කිය වන නිසාය.

රනිල් වික්‍රමසිංහලා බියට පත්ව ඇත්තේ රටත්, ජනතාවත් මුහුණ දී ඇති අර්බුදයට නොවේ. එම අර්බුදය විසින් ඔවුන්ගේ ක්‍රමයත් ඔවුන්ගේ පංතියේ පාලනයත් අහෝසි කිරීම සඳහා පෙළගැසෙන ජනතා බලවේග යන්ටය. නිවැරදි දේශපාලන නායකත්වයක් සහිත එම ජනතා බලවේගයන් රනිල් වික්‍රමසිහලාගේ වහසි බස්වලින් නතර කළ නොහැකි බව පමණක් අවසාන වශයෙන් අවධාරණය කළ යුතුය.

# අරගලයෙන් කිසිවක් නූගත් ආණ්ඩුව

රනිල් වික්‍රමසිංහ ජනාධිපති ලෙස පත්කරනු ලැබ දැන් මාස 05ක පමණ කාලයක් ගතවී තිබේ. රනිල්ගේ මූලිකත්වයෙන් පැරණි ආණ්ඩුව තවමත් ගමන් කරමින් සිටින්නේ ජනතාව ප්‍රතික්ෂේප කළ සමාජ ආර්ථික දේශපාලන ගමන් මගේමය. ඔවුන් ජනතාවගේ අරගලයෙන් කිසිවක්ම ඉගෙන ගෙන නැති බවත් එලෙස ඉගෙන ගැනීමට ඕනෑකමක්ද නැති බවත් දැන් පැහැදිලිය.

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට තනතුර අත්හැරීමට සිදුවන මට්ටමේ දැවැන්ත ජනතා නැගිටීමත්, පොදුජන අරගලයත් සිදුවී තවම මාස 6ක් වත් ගතවී නැත. එම අරගලය කාටවත් සැඟවිය නොහැකි, සුළුකොට තැකිය නොහැකි ප්‍රබල අරගලයකි. එම අරගලය එක් අතකින් මතුවූයේ (ජනතා විරෝධය පුපුරා ගියේ) ඉන්ධන හා ගෑස් හිඟය, විදුලිය කප්පාදුව, බඩු මිල වැඩිවීම වැනි ආර්ථික පීඩනය ආසන්න සිදුවීම කරගෙනය. එහෙත් එම අරගලය තුළ මෙතෙක් අපේ රටේ පවත්වාගෙන ආ ජාවාරම්කාරී ආර්ථිකයට මෙන්ම ජාවාරම්කාර දූෂිත දේශපාලන සංස්කෘතියටද ප්‍රබල විරෝධයක් ගැබ්ව තිබිණි. අරගලයේ සියලු දෙනා ඉල්ලා සිටියේ ක්‍රමයේ වෙනසකි.

රට විකුණන, ණයට කන, නිෂ්පාදන මාර්ග දුර්වල කරන, ජනතාව මත බර පටවන කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්තියටත් වංචාව, දූෂණය, නාස්තිය රජකරන, කළු සල්ලි උපයන, ජාවාරම්කාරී දේශපාලන සංස්කෘතියටත්, බලය හා වරප්‍රසාදවලින් හිස උදුම්මාගෙන ජනතාවට උඩින් දේශපාලඥයින් වැජඹෙන ප්‍රභූ දේශපාලන රටාවටත් ජනතාවගේ විශාල විරෝධයක් තිබිණි. මැයි 09 දා හා ජූලි 09දා ආශ්‍රිතව පුපුරා ගිය ජනතා කෝපය හා සිදුවූ බොහෝ සිදුවීම් තුළ මෙය ගැබ්ව තිබිණි. ආණ්ඩුව හෝ ආණ්ඩුවේ නායකයන් කළ යුතුව තිබුණේ එම ජනතා විරෝධයේ පදනම හඳුනාගෙන සිය ගමන්මග වෙනස්කිරීම වුවත් රනිල් - රාජපක්ෂ පාලනය පැරණි මඟම ගමන්කරමින් සිටී. රනිල් රාජපක්ෂ ආණ්ඩුව සමාජවාදය හෝ සාධාරණ සමාජයක් ගොඩනගනු ඇතැයි අපි සිහිනෙන්වත් නොසිතමු. එහෙත් ධනවාදය තුළ පවත්වාගත යුතු අවම සාධාරණය, සදාචාරය හා ආර්ථික වර්ධනයවත් පවත්වා ගැනීමට තමන් සූදානම් නැති බව දැන් ඔවුන් විසින් පෙන්වා දෙනු ලැබ තිබේ.

රනිල් වික්‍රමසිංහ 2023 සඳහා ඉදිරිපත් කළ අයවැය ලේඛනයේ සාරය හා දිශානතිය දෙස බලනවිට පෙනෙන්නේ ඔවුන් මෙතෙක් ආ බංකොලොත් ආර්ථික හා දේශපාලන ගමන්මගෙන් දශමයකින් හෝ වෙනස් වීමට සූදානම් නැති බවය. මෙම ඇයවැය තුළ අනාගතවාදී ආර්ථික දැක්මක් නැත. මෙහි ඇති ප්‍රධානතම හරය වන්නේ ජනතාව මත බදුබර පටවා රජයේ ආදායම් වැඩිකර ගැනීම, ලාභ ලබන රාජ්‍ය ආයතන පවා විකුණා මුදල් ටිකක් සොයා ගැනීම හා ඉදිරි



වසර සඳහාද නව තවත් ණය ගැනීමය.

අපේ රට, වර්තමානයේ පවතින දරුණු අර්බුදයට ඇද දැමුයේ ඉහත ආර්ථික ක්‍රියාමාර්ග විසිනි. එය වෙනස් කර නිෂ්පාදන ආර්ථිකයක් හදනවා වෙනුවට, ආර්ථිකයේ සාධාරණත්වය තහවුරු කර පොදු ජනතාව වෙත ආර්ථික ප්‍රතිලාභ ලැබෙන ක්‍රමයක් සකස් කරනවා වෙනුවට මෙවරත් ඔවුන් විසින් සිදු කර ඇත්තේ පොදු ජනයාගෙන් කොල්ලකෑමත්, විකිණීමත් මගින් උපයා ගන්නා මුදල් ඔවුන්ගේම ආරක්ෂාවට, පහසුවට වියදම් කර ගැනීමය.

ඉන් පෙනෙන්නේ රනිල් වික්‍රමසිංහලා මහජන අරගලයේ හරය අත්දැකීමක් බවට පත්කරගෙන නොමැති බවය. දැන් රනිල් වික්‍රමසිංහලා කරනුයේ සිය පාලනයට අභියෝග කළ එකී මහජන නැගිටීමෙන් ඉගෙන ගන්නවා වෙනුවට මහජන නැගිටීමට ගරහමින් එයට අවමන් කරමින්, ඊට දායකවූවන් කෝපයෙන් මර්දනය කරමින් සුපුරුදු ජාවාරම්කාරී හා නාස්තිකාරී ගමන් මගේම යාමය.

ඒ අනුව එකක් පැහැදිලිය. එනම් රටත් මෙරට ජනතාවත් වර්තමානයේ පත්ව ඇති ව්‍යසනයෙන් මුදා ගැනීමට මොවුනට හැකිවන්නේ නම් නැත. අර්බුදය විසඳෙන්නේ හෝ විසඳන්නේ නැත. ආණ්ඩුව කරමින් සිටින්නේ අර්බුදය විසඳිය හැකි මාවත් අවුරමින් අර්බුදය වැඩිකරන මගේම ගමන් කිරීමකි. ඉන් සිදුවන්නේ ජනතා අරගල අවසන් කිරීම වෙනුවට නව අරගල සඳහා හේතු සාධක නිර්මාණය කිරීමක් පමණි.

මෙරට ජනතාව මුහුණදී ඇති තියුණු අර්බුදයන් විසඳීමට වර්තමාන ක්‍රමය මෙන්ම රනිල් වික්‍රමසිංහලාත් අසමත් බව දැන් ඉතා පැහැදිලිය. ආණ්ඩුව සිටින්නේ එක්අතකින් "නැව ගිලුනත් බෑන්ඩ් චූන්" ප්‍රතිපත්තියේය. රෝමය ගිනි ගනිද්දී විනා වාදනය කළ 'නීරෝ' ලෙසය.

රනිල් - රාජපක්ෂ පාලනය දැන් උත්සාහ කරන්නේ ජනතා නැගිටීම් ඇතිවීමට බලපාන හේතු නැතිකිරීමට නොව බියවැද්දීම් මගින් ජනතා අරගල නැවැත්වීමටය. එය ලොව කිසිදු තැනක සාර්ථක වූ ක්‍රියාමාර්ගයක් නොවන බව ඉතා පැහැදිලිය. එබැවින් සමාජයෙත්, ආර්ථිකයෙත්, දේශපාලනයෙත් සැබෑ වෙනසක් වෙනුවෙන් සටන් කිරීමටත් පෙළගැසීමටත් ජනතාවට සිදුවේ. අර්බුදයෙන් මිදීමට ජනතාවට වෙනත් මඟක් නැත.

මේ වනවිට ලංකාවේ ධනේශ්වර දේශපාලනයේ සියලු කඳවුරු පිරිහී දුර්වල වී සිසීකඩව යමින් තිබේ. එයද මේ අර්බුදයේම ප්‍රකාශනයකි. මේ වනවිට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (පොහොට්ටුව) ජන පදනමක් නැති පක්ෂයක් බවට පත්ව තිබේ. ඒ අතර එහි සහයෝගයට සිටි උදව්කාර කුඩා පක්ෂ සියල්ල එය හැරගොසිනි. එහි සමහර කණ්ඩායම් විපක්ෂයේ අසුන් ගනු ලැබ තිබේ. එයට දැන් නායකයෙක් හෝ නායකත්වයක් නැත. එය විසිරී ගිය දියවී යන්නක්ව තිබේ. එසේම ශ්‍රීලනිපයද කෑලි කැඩෙමින් විවිධ අය විවිධ තීරණ ගනිමින් එහෙට මෙහෙට කරණම් ගසමින් එහි පැවැත්ම අහෝසි කර තිබේ. සජබ ද සිටින්නේ අර්බුදයකය. එයට අලුත් වීමට, අලුත් පෙනුමක් ලබා ගැනීමට නොහැකිවී ඇත. එයට ජනතා ආකර්ෂණය නැත. ප්‍රතිපත්තිවලින් රනිල් හා වෙනසක්ද නැත. මේ තත්වය විසිනුත් නව විකල්ප දේශපාලන බලවේගයකට ඉඩ විවර කරනු ලැබ ඇත.

රට තුළ පවතින අර්බුදය විසඳනවා වෙනුවට, අරගලයෙන් පාඩම් ඉගෙනගන්නවා වෙනුවට අරගලයට තඩිබාමින් පරණ ගමන්මගේම යන රනිල් - රාජපක්ෂවරුන්ගේ දේශපාලන ගමනත්, නිම නොවී යළි යළිත් උග්‍රවන ආර්ථික හා සමාජ අර්බුදයත්, සම්ප්‍රදායික ධනේශ්වර පක්ෂ හා කල්ලිවල බංකොලොත්කමත් විසින් නව දේශපාලන ගමනක් සඳහා නව දේශපාලන බලවේගයකට මාවත විවර කර දී තිබේ.

රනිල් ඇතුළු ප්‍රතිගාමීන්ගේ කුමන්ත්‍රණවලට, අවලාදවලට තර්ජනය කිරීම් හෝ බියවැද්දීම්වලට ජනතාව අලුත් දේශපාලන මඟක් ගැනීමට පෙරට ඒම වැළැක්විය නොහැක. එසේම වෙනසක් වෙනුවෙන්, ජීවත්වීම වෙනුවෙන් පැන නගින ජනතා අරගල නැවැත්වීමටද ඔවුනට නොහැක. රනිල් වික්‍රමසිංහලා මේ ගමන් කරමින් සිටින්නේ අගාධය වෙතය. එයට එරෙහිව ජයග්‍රහණය වෙත ගමන්කිරීම ජනතාවගේ වගකීමය.

> රනිල් - රාජපක්ෂ පාලනය දැන් උත්සාහ කරන්නේ ජනතා නැගිටීම් ඇතිවීමට බලපාන හේතු නැතිකිරීමට නොව බියවැද්දීම් මගින් ජනතා අරගල නැවැත්වීමටය. එය ලොව කිසිදු තැනක සාර්ථක වූ ක්‍රියාමාර්ගයක් නොවන බව ඉතා පැහැදිලිය. එබැවින් සමාජයෙත්, ආර්ථිකයෙත්, දේශපාලනයෙත් සැබෑ වෙනසක් වෙනුවෙන් සටන් කිරීමටත් පෙළගැසීමටත් ජනතාවට සිදුවේ. අර්බුදයෙන් මිදීමට ජනතාවට වෙනත් මඟක් නැත.





# YES WE CAN

## අපේ අම්මලා ගණිකා ජාවාරමට තල්ලු කරන අයවැයක්!

පසුගියදා ඕමානයේදී අපේ රටේ කාන්තාවන් බලහත්කාරයෙන් ගණිකා ජාවාරමේ යෙදවූ පුවතක් අසන්නට ලැබිණි. මෙය පුවතක් ලෙස වාර්තා වුවද වාර්තා නොවන මෙවැනි බොහෝ සිදුවීම්වලට අපේ රටේ කාන්තාවන්ට දිනපතා මුහුණ දීමට සිදුවේ. වසරකට මැදපෙරදිග ගෘහ සේවය සඳහා යන කාන්තාවන්ගෙන් 300කට ආසන්න ප්‍රමාණයක් එම රටවලදී මිය යන අතර තවත් බොහෝ දෙනෙක් විවිධ වධ හිංසාවලට ලක්වෙති.

අල් ජසීරා රූපවාහිනී වාර්තාවකට අනුව මැදපෙරදිගදී අතවරවලට ලක්වී නැවත සිය රට බලා එන ගෘහ සේවිකාවන් අතුරින් 61%ක් විවිධ පහරදීම්වලට ලක්වී ඇති අතර ඉන් 14% ක්ම ලිංගික අතවරයන්ය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2020 සංඛ්‍යා ලේඛන අනුව එම වසර තුළදී පමණක් ගෘහ සේවිකාවන්ගෙන් වාර්තා වූ පැමිණිලි 3052ක් බව දක්වා ඇත.

මෙලෙස විවිධ වධ බන්ධනයන්ට ලක්වීම් හා ජීවිත පවා අහිමි වීමේ අනතුර දැක දැකත් අපේ රටේ අම්මලා විදෙස් ගතවීමට තීරණය කරන්නේ ගෙදර ආර්ථික ප්‍රශ්න, දරුවන්ගේ බඩගිනි ලතෝනිවලට පිළිතුරක් නොමැති තැනය.

එලෙස පවුලේ බර දැරීමට විදෙස් ගතවන කාන්තාවන් අපේ රටේ විදෙස් ආදායමෙන් 51%ක් රැගෙන එන්නේ මේ රටේ බරද ඇගේ කරමත පටවා තිබෙන බව නොදැනය. නමුත් අපේ රටේ පාලකයෝ දැනුවත්ය. රටට විදෙස් ආදායම් ගෙන ඒම සඳහා ලෝකය තුළ දැනුම, පුහුණුව සහිත දියුණු ශ්‍රම වෙළෙඳපොළක් අත්පත් කරගනු වෙනුවට ඉතාම පහසු ක්‍රම සකස් කරමින් පාලකයින් විසින් අපේ රටේ අම්මලා මැදපෙරදිගට අලෙවි කරන්නේ දැනුවත්වමය!

ඒ පමණක්ද නොවේ! අම්මලාගේ කඳුළුවලින් මෙරටට රැගෙන එන ඒ විදෙස් සංචිතද හොරාකමින්, ආර්ථිකය බංකොලොත් කළ පාලකයින් ඒ බරද නැවත එම පවුල්වලටම පටවන්නේ බදු බර, ජීවන බර වැඩි කරමිනි. මේ තත්වය තුළ නැවත නැවත විදෙස් ගතවීමට අපේ රටේ අම්මාවරුන්ට සිදු වී ඇත. 2020 වර්ෂයේදී ගෘහ සේවය සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව 53,703කි. 2021 වසරේදී එය 122,000ක් වූ අතර 2022 වනවිට 224,000ක් ලෙස ගෘහ සේවය සඳහා විදෙස් ගත වන ප්‍රමාණය වාර්ෂිකව වැඩි වී ඇත.

මෙසේ ගෘහ සේවය සඳහා විදෙස්ගත වීමේ වර්ධනයෙන් පෙනෙන්නේ වෙන කිසිවක් නොව අපේ රටේ ආර්ථික කඩාවැටීමේ ප්‍රමාණයයි; ධනේශ්වර පාලකයින්ගේ අදූරදර්ශී අසමත්කමයි. ඒ අසමත්කමේම, අදූරදර්ශීකමේම, බංකොලොත්කමේම දිගුවක් වන 2023 වර්ෂය සඳහා යෝජිත අයවැය තුළද අපේ රටේ අම්මලාට ගණිකා ජාවාරම්කාරයින්ගේ ගොදුරක් නොවී, ආරක්ෂාකාරීව තම දරුවන් සමඟ, නෑ හිතමිතුරන් සමඟ සතුටින් සිටිය හැකි ආර්ථිකයක් ගොඩනගන කිසිදු යෝජනාවක් යෝජනා කර නොමැත. මේ නිසා 2023 අයවැයද අපේ රටේ අම්මලා වැඩි වැඩියෙන් ගණිකා ජාවාරමට තල්ලු කරන අයවැයක් ලෙස නම් කිරීම වැරදි නැත!

## නව ජනවරමකට වහාම අවස්ථාව ලබාදිය යුතුයි

**සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා**



**තරුණයන් ලෙස තමන් පාර්ලිමේන්තුව විශ්වාස කරන බවත් ප්‍රජාතන්ත්‍රවාදී අරගලය විශ්වාස කරන බවත් මහජන බලය විශ්වාස කරන බවත් පැවසූ සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, ආණ්ඩුව නව ජනවරමකට වහාම අවස්ථාව ලබාදිය යුතු බව අවධාරණය කළේය.**

එරංග සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ පසුගිය 25වැනි දින ජවිපෙ ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද සමාජවාදී තරුණ සංගමයේ මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ එරංග සහෝදරයා මෙසේද පැවසීය.

"අයවැය සම්මත කරගෙන පාර්ලිමේන්තුව ඇතුලේ බලය තහවුරු කරගෙන තිබෙන බව පෙන්වන පද අල්ලන අය හිටියත් මේ අයවැය ඇතුලේ ඇත්තටම මොනවාද තිබෙන්නේ. විශේෂයෙන්ම තරුණයන්ට අපේක්ෂා තබාගත හැකි තත්වයක් තිබෙනවාද? 'තරුණයන් ක්‍රියාකාරීව දිරිගැන්වීම' කියලා ඡේදයක් තුළ කෘෂිකර්මයට අදාළව තරුණ තරුණියන් වෙනුවෙන් රුපියල් මිලියන 120ක් වෙන්කර බවත්, සෑම දිස්ත්‍රික්කයකම නියෝජනය වන ලෙස 240ක් තෝරා ගන්නා බවත් කියනවා. මේ අනුව එක තරුණයෙකු කෘෂිකර්මාන්තයට යොමු කරන්න ලක්ෂ පහක් යොදවනවා කියන්නේ අඩුම තරමින් එක කන්නයක්වත් කෘෂිකර්මාන්තයට යොදවන්න බැහැ. තරුණ කාන්තාවන් 1000ක් තෝරාගෙන එක්කෙනෙකුට රුපියල් දෙලක්ෂ පනස්දහසකට වෙන්කෙරෙන බව සඳහන් කර තිබෙනවා. අඩුම තරමින් රූපලාවන්‍ය ආයතනයක් ආරම්භ කරන්න වත් මේ මුදල ප්‍රමාණවත් නැහැ. තරුණ, තරුණියන් විදේශ රැකියා පුහුණු කිරීම සඳහා රුපියල් මිලිනය 50ක් වෙන්කරන බව සඳහන් වෙනවා. අඩුම තරමින් අවුරුද්දකට තරුණයන් 30,000ක් පමණ විදේශ රැකියා සඳහා පිටත් වෙනවා. අවම වශයෙන් අපි 10,000ක් පුහුණු කරන්නේ යැයි සිතුවොත් එක් අයෙකුට වෙන්වෙන්නේ රුපියල් 5000යි.

තාක්ෂණය පිළිබඳවත් කතා ගොඩක් යනවා. නමුත් අයවැයෙන් තාක්ෂණ කටයුතු අමාත්‍යාංශයට වෙන්කර තිබෙන්නේ බිලියන 12යි. දුරකථන ගාස්තු වැඩිවෙලා. ටැක්ස් වැඩිවෙලා. රනිල් රාජපක්ෂලාගේ අයවැය දැක්ම සාරාංශ කරගතහොත් ආරක්ෂක අමාත්‍යාංශයට බිලියන 410ක් වෙන්කර තාක්ෂණයට බිලියන 12ක් වෙන්කරනවා. ඒ වගේම මහජන ආරක්ෂාවට බිලියන 126ක් වෙන්කර තිබුණට ධීවර අමාත්‍යාංශයට බිලියන 06යි. සෞඛ්‍යයට 322ක්, අධ්‍යාපනයට 232ක් සමාජ ආරක්ෂණයට 125ක් සහ කෘෂිකර්මාන්තයට 115ක් බිලියනවලින් වෙන්කර තිබෙනවා. බිලියන 410ක් වෙන් කරන්නේ මහජනතාවගේ ආරක්ෂාවට නොවෙයි. පාර්ලිමේන්තුව ඇතුලේ අටවා ගත්ත රනිල් රාජපක්ෂගේ බලය ආරක්ෂා කරගන්න මේ මුදල් වෙන්කර තිබෙනවා. විශේෂයෙන්ම ලෝක වෙළඳපොළේ වැඩි ඉල්ලුමක් තිබෙන මානව සම්පත දියුණු කිරීම වෙනුවෙන් විශාල මුදලක් වෙන්කළ යුතුයි. තෙල් තිබෙන සෞදි අරාබියේ අපනයන ආදායම 2019දී ඩොලර් බිලිය 113යි. නමුත් ඉන්දියාව අයි.ටී. තාක්ෂණය විකුණලා ඩොලර් බිලියන 130ක් විදේශ විනිමය උපයාගෙන තිබෙනවා.


මේ අයවැය තුළ ගජමිතුරන් සහ අයි.එම්.එෆ්. එක පිනවීම හැර වෙන කිසිවක් නැහැ. පසුගිය මාස අට තුළ ලක්ෂ පහක් පමණ තරුණ තරුණියන්ට රැකියා අහිමි වී දැවැන්ත බුද්ධි ගලනයක් සිදුවෙමින් තිබෙනවා. මහ බැංකුවේ පමණක් අසූවක් පමණ විදේශ රැකියාවලට ගොස් තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මේ ඉදිරිපත් කර තිබෙන්නේ බොම්බයි මොටයි අයවැයක් මිස වෙන දෙයක් නොවෙයි.

රනිල් වික්‍රමසිංහ සද්දය දාන කලාපයක් බවට පාර්ලිමේන්තුව පත්කරගෙන තිබෙනවා. මීට වඩා සද්දය දැමූ අයට සිදුවුණේ කුමක්ද කියලා මෑත අතීතයේ පාඩම් තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පාවිච්චි කරමින් අපි අරගල කරනවා. මහජන බලයේ අපට තිබෙන අයිතිය පාවිච්චි කරමින් ජීවිතය විඳව විඳවා ඉන්නවා වෙනුවට ජීවිතය දිනන්න අරගලයක් දියත්කර තිබෙනවා. 26වෙනදා සිට සීතල මාස උණුසුම් කරමින් සමාජවාදී තරුණ සංගමයත් ප්‍රගතිශීලී ජනතාවත් එකතු වී වීදි පුරා උණුසුම් අරගලය ආරම්භ කරනවා. ඉන්පසු ලංකාවේ නගර පුරාත් දිස්ත්‍රික්ක පුරාත් මේ අරගලය දියත් කරනවා.

ආණ්ඩුව නව ජනවරමකට වහාම අවස්ථාව ලබාදිය යුතුයි. ඒ වෙනුවෙන් නව ජනවරමක් දිනාගැනීමේ අරගලය අපි දියත් කරනවා. නව පුරවැසියෙක් බිහිකිරීමේ අරගලය දියත් කරනවා. 74 වසරක පාලනය අවසන් කර මහජන පාලනයක් වෙනුවෙන් පෙළගැසීමේ අරගලය අපි දියත් කරනවා."

## වසර අග්ගිස්සක පැතුම...

සීතලෙන් පුපුරන
හිරිගඩු උහුලන
උඳුවප් මහට සමුදී,
දුක් ගෙවා වසක්,
තව වසක් අභිමුව..
සැරිසරා විශ්වයේ අහුමුළු
හිරු ගෙනත් අවරින් බැසගිය
නව ලොවක් වෙනුවෙන්
අදිටන
මහත් එළියක් එළඹෙන
සත් සමුදුරට ඉහළින් දිදුලන
ප්‍රභාවක්ද?
මනරම්ද හෙට දින..?
පසක් කළ යුතුමය,
මේ අම්හිරි කටුක,
ලොබ බැඳි කුරිරුකම්
උනාදමා සැණෙකින්
සුම්හිරිම දිවියකට
මංපෙත් කියාදෙන
මානව ප්‍රේමයට ලොබ බඳින
නව මිනිස් පවුරක
නව ලොවක් වනු පිණිස..
නව පැතුම් පණදෙන..



UPDATE

### නවසීලන්තයේ ඡන්ද බලය අවුරුදු 16ට අඩු කිරීමට අවධානය



වයස අවුරුදු 16 සපිරුණු පිරිසට රථ වාහන බලපත්‍ර, වාහන බලපත්‍ර, ලබාගැනීම පූර්ණ කාලීන සේවයේ යෙදවීම හා බදු ගෙවීමේ අවස්ථාව ගැන සලකා බලමින් අවුරුදු 16ට වැඩි පිරිස සඳහා ඡන්ද අයිතිය ලබාදීම පිළිබඳව 2020 වර්ෂයේ දී කිසියම් පිරිසක් අධිකරණය හමුවේ පවසා සිටීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ පිළිබඳව සොයා බලමින් සිටින බවට එරට අගමැතිනිය ජෙසින්ඩා ආර්ඩේන් පවසා ඇත.

### චෙන් ඩොන්ග් වැඩිම කාලයක් අභ්‍යවකාශයේ සිටි චීන ගගනගාමියා වෙයි



දින 198 ක කාලයක් අභ්‍යවකාශයේ රැඳී සිටි චීන ජාතික වෑන්ග් යැන්ග්පින්ගේ වාර්තාව බිඳ දමමින් චීන ගගනගාමී චෙන් ඩොන්ග් දින 200 කට අධික කාලයක් අභ්‍යවකාශයේ ගත කරමින් නව වාර්තාවක් තැබීමට සමත් වී ඇත. ඔහු අවස්ථා දෙකකදී අභ්‍යාවකාශයට යාමට සමත්ව තිබේ.

### බ්‍රිතාන්‍ය මන්ත්‍රී නත්තල් සාද වියදම් ආපසු ගෙවීමට දැඩි විවේචන



බ්‍රිතාන්‍ය ස්වාධීන පාර්ලිමේන්තු වරප්‍රසාද අධිකාරිය (IPSA) මගින් පසුගිය 22 දා නිකුත් කළ උපදෙස් මාලාවට අනුව එරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිය කාර්යාලය තුළ පවත්වන නත්තල් උත්සව සඳහා වියදම් "ආගන්තුක සත්කාර" වියදම් යටතේ ආපසු ලබා ගැනීමේ හැකියාව උදා වී ඇත. මෙලෙස වියදම් කෙරෙනුයේ එරට බදු ගෙවන්නන්ගේ මුදල් බවත්, එවැනි දරුණු ආර්ථික අර්බුදකාරී තත්වය හමුවේ මන්ත්‍රීවරුන්ගේ මෙවැනි වියදම් පිළිගත නොහැකි බවටත් එරට ජනතාවගේ දැඩි විවේචනයට ලක්ව ඇත.

# බුද්ධි ගලනයේ සමාජ ආර්ථික බලපෑම



ප සුගිය දශක තුනකට වැඩි කාලයක් තුළදී මෙරටින් බිහි වූ උගත්හු බුද්ධිමත්හු ලක්ෂ ගණනක් රට හැරදා ගොස් සිටිති. තවත් විශාල පිරිසක් රැකියා සඳහා රට හැර ගොස් සිටිති. රට හැර ගොස් ඇති ප්‍රමාණය ආසන්න වශයෙන් ලක්ෂ 30ක් බව වාර්තා වේ. මෙම ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් ලක්ෂ විස්සක් මැදපෙරදිග රටවල සේවය කරනු ලබයි.

එම පිරිසෙන් 90%කට වැඩි ප්‍රමාණයක් කාන්තාවන්ය. එසේම ඔවුන්ගෙන් 90%කට වැඩි ප්‍රමාණයක් නුපුහුණු හෝ අර්ධ පුහුණු රැකියාවල නිරත වෙති. අනෙක් පිරිස එංගලන්තය ඇතුළු යුරෝපා රටවලත් ඕස්ට්‍රේලියාව, කැනඩාව, නවසීලන්තය, ඇමරිකාව, ඉන්දියාව වැනි රටවල සේවය කරති. මෙම කොටසින් 80%ක් පමණ පිරිසක් පුහුණු ශ්‍රමිකයන් හෝ වෘත්තිකයන්ය. ඔවුන්ගේ බහුතරය සාපේක්ෂව ඉහළ වැටුප් තල වලට හිමිකම් කියනු ලබන පිරිස් වේ. නමුත් විදේශ මුදල් ප්‍රේෂණය කිරීමේදී ඔවුන්ගේ දායකත්වය අඩුවේ. ඊට හේතුව ඔවුන් බහුතරයක් එම රටවල ස්ථාවරත්වයක් ගොඩ නගාගෙන තිබීම නිසා ඔවුන් උපයන මුදල් අත්‍යවශ්‍ය කාරණාවලට හැර මෙරට එවීමට පෙළඹීමක් නැතිවීමය.

පසුගිය කාලය තුළ පුපුරා ගිය අපේ රටේ ආර්ථික අර්බුදය හමුවේ අප රටේ යම් ස්ථාවරත්වයක් සහිතව ජීවත් ජීවත් වූ වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ, තොරතුරු තාක්ෂණ, විද්‍යා, කෘෂි විද්‍යා, වෛද්‍ය පරිපූරක වෛද්‍ය ආදී ක්ෂේත්‍රයන්හි බහුතරයකට රැකියාවෙන් ලැබෙන වැටුප සහ අනෙකුත් ආදායම් පහළ වැටීම හේතුවෙන් බරපතළ ආර්ථික අස්ථාවරත්වයට පත් විය.

මේ තත්ත්වය හමුවේ ඔවුන්ගෙන් බහුතරය රට හැර යාම හෝ විදේශ රැකියාව සඳහා රටින් පිටවීමට සූදානම්ව සිටියි. මේ වසරේ මේ වන විටත් විශේෂඥ වෛද්‍යවරුන් සියයකට ආසන්න පිරිසක් රට හැරගොස් ඇති අතර වෛද්‍යවරුන් 800 ආසන්න ප්‍රමාණයක් රටක් හැර ගොස් සිටිති. හෙද හෙදියන් 1000කට ආසන්න ප්‍රමාණයක් රට හැර ගොස් සිටිති. වෛද්‍ය, හෙද ඇතුළු සෞඛ්‍ය සේවයේ දහස් ගණනින් රට හැර යාම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ගනිමින්, අදාළ විභාග සඳහා පෙනී සිටිමින් සූදානම් වෙමින් සිටිති.

එම ප්‍රමාණය 20,000 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කළ හැකිය. සෞඛ්‍ය අමාත්‍යංශය හෝ රජයේ තොරතුරු ලබාගත හැකි අංශවලින් මේ පිළිබඳ යාවත්කාලීන වූ තොරතුරු ලබා ගැනීමේ හැකියාවක් නොමැත. ඔවුන් සතුවද තොරතුරු නොමැත. මෙම තත්වය අඛණ්ඩව ඉදිරියට යාම තුළ වෘත්තිකයන්ගේ හිඟයෙන් සෞඛ්‍ය සේවාව තවදුරටත් බිඳ වැටීමට නියමිතය. මෙවැනි රට හැරයාම් සිදුවන්නේ දැනටමත් ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් අවම වශයෙන් 20,000ක හිඟයක් සහ හෙද හෙදියන් 30,000 ක හිඟයක් ඇති බවට තොරතුරු තිබෙන තත්වයකය.

ඕස්ට්‍රේලියාවේ හෙදියගේ සාමාන්‍ය වාර්ෂික වැටුප ඩොලර් 87,426 ක් පමණ වන අතර එය පැයකට ඩොලර් 44ක් පමණ වේ. ඕස්ට්‍රේලියාවේ වෛද්‍යවරු සාමාන්‍ය වාර්ෂික වැටුප ඩොලර් 165,750 ක් පමණ වන වේ. ඒ අනුව පැයකට ඩොලර් 85ක පමණ වැටුපක් හිමිය. එංගලන්තයේ හෙදියකුගේ සාමාන්‍ය වාර්ෂික වැටුප පවුම් 35,000ක් පමණ වේ. එනම් පැයකට පවුම් 18 ක් පමණ ගෙවීමක් සිදු කරයි. එංගලන්තයේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ වාර්ෂික වැටුප පවුම් 5860 පමණ වන අතර පැයකට පවුම් තිහක් පමණ ගෙවීමක් සිදු වේ. මෙම වැටුප් රෝහලෙන් රෝහලට සහ ක්ෂේත්‍රයෙන් ශ්‍රේෂයට වෙනස් වේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ වෛද්‍ය සහ හෙද වැටුප්වලට සාපේක්ෂව විදේශයන්හි ගෙවනු ලබන වැටුප් ඉහළ මට්ටමක තිබීම නිසා සහ භාෂාව පිළිබඳ ගැටලු අවම නිසා එංගලන්තයට ඕස්ට්‍රේලියාවට හා නවසීලන්තය යන රටවලට යෑමට සෞඛ්‍ය වෘත්තිකයෝ වැඩි කැමැත්තක් දක්වති. එසේ වුවද සාපේක්ෂව අඩු වැටුපක් ගෙවනු ලැබුවද මැදපෙරදිග සිංගප්පූරුවට වැනි රටවලට විශාල සෞඛ්‍ය වෘත්තිකයන් ප්‍රමාණයක් රැකියාවට ගොස් ඇති අතර තවත් විශාල පිරිසක් රැකියාවට යාමට සූදානමින් සිටිති.

මේ ආකාරයට ශ්‍රී ලංකාවේ උගතුන් හා බුද්ධිමතුන් රට හැර යෑමේ දරුණු අනතුරකට මුහුණ දී ඇත. සෑම ක්ෂේත්‍රයක්ම සංවර්ධනය කෙසේවෙතත් දිනෙන් දිනම වේගයෙන් බිඳවැටෙමින් පැවතීම නිසා ඒ ඒ ක්ෂේත්‍රවල උගතුන් ප්‍රවීණත්වයක් සහිත දක්ෂයන්ගේ බලාපොරොත්තු දිනෙන් දිනම වේගයෙන් බිඳවැටෙමින් පවතී.

රටේ දේශපාලන ස්ථාවරත්වය දිනෙන් දිනම පහළ වැටීම රටේ පවතින ගැටුම්කාරී වාතාවරණය, ආර්ථික අවස්ථා අහිමි වීම නිසා මුදල් නොමැති වීම, බදු විශාල ලෙස ඉහළ යාම, දරුවන්ගේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා ප්‍රවේශය අවම වීම ආදී කරුණු නිසා දිනෙන් දිනම බිඳවැටෙන ජීවිතයේ ගුණාත්මකභාවය හමුවේ බොහෝ දෙනෙක් විකල්පය ලෙස රට හැරයාම තෝරාගෙන ඇත.

උගතුන් හා ඒ ඒ ක්ෂේත්‍රවල වෘත්තිකයින් රට හැරයාම තවදුරටත් එම ක්ෂේත්‍රයන් ආගාධයකට ඇද දැමීමට හේතු වේ. ප්‍රධාන වශයෙන්ම ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ වෘත්තිකයින්ගේ, ප්‍රවීණත්වය, දක්ෂයන්ගේ දායකත්වය නොලැබී යාම නිසා ඒ ඒ ක්ෂේත්‍ර තවදුරටත් කඩා වැටෙනු ඇත. සෞඛ්‍ය අධ්‍යාපන, ඉංජිනේරු, විද්‍යා, කෘෂි විද්‍යා, තාක්ෂණ, තොරුතුරු තාක්ෂණික ඇතුළු ක්ෂේත්‍ර තවදුරටත් බිඳවැටෙනු ඇත. වෘත්තිකයින් විසින් ගෙවනු ලැබූ බදු හා රජයට ලැබෙන අනෙකුත් ආදායම් රජයට අහිමි වීමෙන්ද ඇතිවන බලපෑම අතිමහත්ය.

පෙළගැසෙමින් තිබෙන ආකාරයට රටේ උගතුන්, බුද්ධිමතුන් සහ වෘත්තිකයින් ලක්ෂ ගණනක් රට හැරදමා ගියහොත් මානව ප්‍රාග්ධනයේ සිදුවන අහිමි වීම නිසා ඒ ඒ ක්ෂේත්‍රවල සිදුවන දරුණු කඩාවැටීම යළි යථා තත්වයට පත්කිරීම පහසු කරුණක් නොවනු ඇත.

> උගතුන් හා ඒ ඒ ක්ෂේත්‍රවල වෘත්තිකයින් රට හැරයාම තවදුරටත් එම ක්ෂේත්‍රයන් ආගාධයකට ඇද දැමීමට හේතු වේ. ප්‍රධාන වශයෙන්ම ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ වෘත්තිකයින්ගේ, ප්‍රවීණත්වය, දක්ෂයන්ගේ දායකත්වය නොලැබී යාම නිසා ඒ ඒ ක්ෂේත්‍ර තවදුරටත් කඩා වැටෙනු ඇත. සෞඛ්‍ය අධ්‍යාපන, ඉංජිනේරු, විද්‍යා, කෘෂි විද්‍යා, තාක්ෂණ, තොරුතුරු තාක්ෂණික ඇතුළු ක්ෂේත්‍ර තවදුරටත් බිඳවැටෙනු ඇත. වෘත්තිකයින් විසින් ගෙවනු ලැබූ බදු හා රජයට ලැබෙන අනෙකුත් ආදායම් රජයට අහිමි වීමෙන්ද ඇතිවන බලපෑම අතිමහත්ය.



"තමන්ගේ සියලු වැරදි සහ ශක්තීන් සහිත මනුෂ්‍යයෝ සමාජ ව්‍යාපාරයක යාන්ත්‍රණය සංයුක්ත කරති. ඔවුන් වැරදි කළ යුතුය. එසේම වැරදිවලින් පාඩම් උගත යුතුය. වඩ වඩාත් වැරදි කළ යුතුය. එම වැරදිවලින් අලුතින් උගත යුතුය. ඔවුන ජයග්‍රහණය මෙන්ම පරාජයද රස බලා, ඒ එක් එක් අවස්ථාව සමග ජීවත්වන්නේ කෙසේදැයි සොයා ගත යුතුය. කාලය සහ ක්‍රියාව ගුරුවරුන්ය."

**මාටින් ලූතර් කිං**

# වමට අපේක්ෂා දල්වන ලතින් ඇමරිකාව



ඔක්තෝබර් 30 වන දින පැවති ජනාධිපතිවරණයෙන් බ්‍රසීලයේ වාමාංශික අපේක්ෂක ලූලා ද සිල්වා ජයග්‍රහණය කළේය. ජනාධිපතිවරණයේ දෙවන වටයේ දී ලූලා ද සිල්වා 50.9% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිද්දී ඔහුගේ ප්‍රතිවාදී අපේක්ෂක, වත්මන් ජනාධිපති බොල්සොනාරෝ 49.1%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට සමත් විය. එය ඉතාම තියුණු ජයග්‍රහණයක් ලෙස සැලකෙන්නේ පළමු වටයේදී ලූලා ද සිල්වාට සියයට 50කට වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට නොහැකි වීම යන කරුණද එක්ව ගෙන විමසා බැලූ විටය. එසේ වුවත් ලූලා ද සිල්වාගේ ජයග්‍රහණය බ්‍රසීලයට දැවැන්ත ඉදිරි පිම්මකි. එපමණක් නොව එය ලතින් ඇමරිකාවටම ඉදිරි පිම්මකි.

### වමට හැරීම

විසිවන සියවස අවසානයේදී හා විසිඑක්වන සියවස ආරම්භයේදී ලතින් ඇමෙරිකාවේ රටවල් දහයකට වැඩි ගණනක වාමාංශික පාලනයන් ඇතිවිය. එහෙත් 2015 ආර්ජන්ටිනාවේ මහමැතිවරණයෙන් අනතුරුව ලතින් ඇමෙරිකාවේ බොහෝ වාමාංශික පාලනයන් මැතිවරණ පරාජයන් අත්වින්දේය. අධිරාජ්‍යවාදීන් එය විග්‍රහ කළේ 'ලතින් ඇමරිකාවේ වාමාංශික ව්‍යාපාරයේ අවසානය' ලෙසය. එහෙත් යන්තම් අවුරුදු තුනක් ගත වෙද්දී, එනම් 2018 මෙක්සිකෝවේ වාමාංශික ආණ්ඩුවක් බිහි වීමත් සමග වෙනිසුවෙලාව, කොස්ටරිකා, ආජන්ටිනාව, බොලීවියාව, පීරූ, කොලොම්බියාව ආදී රටවල් ගණනාවකම වාමාංශික පක්ෂ මැතිවරණ ජයග්‍රහණයන් අත්පත් කර ගත්තේය. එකී ගොන්නට අලුතින්ම එක් වූයේ බ්‍රසීලයයි. මේ වන විට ලතින් ඇමෙරිකාවේ රටවල් අතරින් තුනෙන් දෙකක් පමණ වාමාංශික ආණ්ඩු සහිත රටවල් බවට පත් වී තිබේ.

### බ්‍රසීලයට නව බලාපොරොත්තුවක්

ලූලා ද සිල්වා සිය මැතිවරණ ව්‍යාපාරයේදී දුන් ප්‍රධාන පොරොන්දු වූයේ සමාජ අසමානතාව නැති කිරීම, දුප්පත්කම තුරන් කිරීම, ධනපතියන්ට බදු ගැසීම, සමාජ ආරක්ෂණ ජාලයක් හඳුන්වා දීම හා  අවම වැටුප ඉහළ දැමීම ආදියයි. ලූලා ද සිල්වාගේ ජයග්‍රහණය තුළ බ්‍රසීල ජනතාවට නව අපේක්ෂාවන් රැසක් ඇතිවී තිබේ. ඒ අනුව බ්‍රසීලයේ ප්‍රධාන ගැටලුවක්ව පවතින ඇති නැති පරතරය (බ්‍රසීලයේ ධනවත්ම සියයට එක - ආසන්න වශයෙන් මිලියන දෙකක් පමණ - රටේ සමස්ත ආදායමෙන් සියයට දහතුනක් පමණ භුක්ති විඳියි) ඉදිරි කාලය තුළදී අඩු කර ගැනීමට හැකි වනු ඇත. එසේම පුළුල් සමාජ සුබසාධනයන්ද ජනතාවට හිමි වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. එසේම ලෝකයේ පෙනහල්ල ලෙස හඳුන්වන ඇමසෝන් වනාන්තරයේ සිදු වන විනාශය නැවැත්වීමටත් අනෙකුත් ස්වාභාවික පරිසර පද්ධතින් ආරක්ෂා කර ගැනීමටත් හැකි වෙතැයි බලාපොරොත්තු විය හැකිය. එපමණක් නොව ජාත්‍යන්තර දේශපාලනයේදී දැනට වඩා වැඩි වැදගත්කමක් අත්පත් කරගැනීමට බ්‍රසීලයට හැකිවනු ඇත.

### අධිරාජ්‍යවාදයට පරාජයක්

අනෙක් අතට අන්ත දක්ෂිණාංශික හා අධිරාජ්‍ය ගැති පුද්ගලයෙකු වන බොල්සෙනාරෝගේ පරාජය, කලාපය තුළ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ බලපෑමට එල්ල කළ දරුණු පහරක්ද වන්නේය. පසුගිය කාලය තුළදී වෙනිසියුලාව දුර්වල කිරීමේ එක්සත් ජනපද ක්‍රියාමාර්ගවලටද ලතින් ඇමරිකානු කලාපය තුළ එක්සත් ජනපද වුවමනාවන් ඉටු කරමින් ක්‍රියාත්මක වන ඊනියා මත්ද්‍රව්‍යවලට එරෙහි යුද්ධයටද බොල්සෙනාරෝ පාලනය මහත් ආශීර්වාදයක් විය.

එසේම මෙකී වෙනස චීනය හා දකුණු ඇමෙරිකානු රටවල් අතර විශේෂයෙන් බ්‍රසීලය සමග වෙළඳ සබඳතා වර්ධනය වීමටත් විශේෂයෙන්ම චීනයේ නව සේද මාවත් ව්‍යාපෘතියට බ්‍රසිලය සම්බන්ධ කරවීමටත් ඉඩකඩ විවර කරයි. තවද බහු පාර්ශ්වික ලෝකයක් ගොඩ නැගීමේදීද ලෝක සාමය හා ගෝලීය ස්ථාවරභාවය ශක්තිමත් කිරීමේදීද මෙම වෙනස වැදගත් පියවරක් වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

### අභියෝග පරාජය කිරීම

එහෙත් ඒ අතරම මේ සියලු ජයග්‍රහණයන් බාධකවලින් තොරව අත්පත් කරගත හැකි යැයි අපේක්ෂා නොකළ යුතුය. මේ වන විටත් පරාජිත අපේක්ෂක බොල්සෙනාරෝ විසින් ඔක්තෝබර් 30 ජනාධිපතිවරණ ප්‍රතිඵල අභියෝගයට ලක් කරමින් එරට මැතිවරණ අධිකාරිය ඉදිරියේ පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබ තිබේ. ඔහු ඉලෙක්ට්‍රොනික යන්ත්‍ර යොදා ගනිමින් ඡන්ද පාවිච්චි කිරීමේදී අක්‍රමකතා සිදුවී ඇති බවත් ඉලෙක්ට්‍රොනික යන්ත්‍ර භාවිතා කර දැමූ ඡන්දවලින් භාගයක් පමණ අවලංගු කළ යුතු බවටත් පැමිණිලි ඉදිරිපත් කර තිබේ. (ලූලා ද සිල්වා ජනාධිපති ධුරයෙහි දිවුරුම් දීමට නියමිතව ඇත්තේ ලබන වසරේ ජනවාරි පළමුවැනි දිනටය.)

දේශපාලන විචාරකයන් ඉදිරිපත් කරන තවත් තර්කයක් වන්නේ මැතිවරණයේදී ඡන්දදායකයින් ඡන්දය පාවිච්චි කළේ ලූලා ද සිල්වාට මිස ඔහුගේ කම්කරු පක්ෂයට නොවන බවයි. එසේම ලූලා ද සිල්වාගේ කම්කරු පක්ෂයට මෙම මැතිවරණයේදී ප්‍රකාශ වූ තරම් ජනතා කැමැත්තක් නොමැති බවයි. එසේම බ්‍රසීලයේ කොංග්‍රසයේ උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ පහළ මන්ත්‍රී මණ්ඩලය යන දෙකෙහිම බලය හිමිවී ඇත්තේ පරාජිත අපේක්ෂක හා හිටපු ජනාධිපති  බොල්සෙනාරෝගේ ලිබරල් පක්ෂයටය. එබැවින් තීරණාත්මක තීන්දු තීරණ ගැනීමේදී එයද ලූලා ද සිල්වා පාලනයට ප්‍රබල බාධකයක් වීමට ඉඩ තිබේ.

## බ්‍රිතානයය: සෞඛ්‍ය සේවකයින් වැටුප් වැඩිවීමක් ඉල්ලා




ජාතික සෞඛ්‍ය සේවයට වැඩි සම්පත් ප්‍රමාණයක්, නව බඳවා ගැනීම් සහ සාධාරණ වැටුපක් ඉල්ලා එක්සත් රාජධානියේ ජාතික සෞඛ්‍ය සේවාවේ සේවකයෝ දැවැන්ත විරෝධතාවක් සහ වැඩවර්ජනයක් දියත් කිරීමට සූදානම් වෙති. මේ දිනවල ඒ සඳහා එංගලන්තයේ, වේල්සයේ හා උතුරු දූපත්වල වෘත්තිය සමිති සාමාජිකයින් සමග සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

රාජකීය  හෙද විද්‍යාලයේ හෙද වෘත්තීය සමිති පසුගිය නොවැම්බර් 09වැනි දින ප්‍රකාශ කර සිටියේ ඔවුන් නත්තලට පෙර වැඩවර්ජනයක් ක්‍රියාත්මක කරන බවයි. ඔවුන් 10.1%ක් පමණ වන උද්ධමනයට මුහුණ දීම සඳහා වත්මන් ආණ්ඩුවෙන්  4.5% සිට 5% දක්වා වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටියද ආණ්ඩුව විසින් එය ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබ තිබේ. එසේම බ්‍රිතාන්‍ය වෛද්‍ය සංගමයේ කණිෂ්ඨ වෛද්‍යවරුන්ද අධික වැඩ සහ අප්‍රමාණවත් ගෙවීම්වලට එරෙහිව ජනවාරි මාසය තුළදී විරෝධතා ක්‍රියාමාර්ගයන්ට එළඹීමට තීරණය කර ඇත.

බ්‍රිතාන්‍යයේ කොන්සවේටිව් පක්ෂ ආණ්ඩුව වසර ගණනාවක සිට ජාතික සෞඛ්‍ය සේවය පුද්ගලික කිරීමේ අදහස ඇතිව ඒ සඳහා වෙන් කරන ප්‍රතිපාදන කප්පාදු කරමින් සිටී. මේ නිසා ජාතික සෞඛ්‍ය සේවයේ සේවකයෝ ජීවන වියදම හමුවේ සිය දෛනික වියදම් සම්පාදනය කරගත නොහැකිව දැවැන්ත ගැටලු ප්‍රමාණයකට මුහුණ පා සිටිති.

## කියුබාව: ජනාධිපතිවරයාගේ සංචාරය මගින් සබඳතා තර කර ගෙන



කියුබානු ජනාධිපති සහ කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ පළමු ලේකම් මිගෙල් ඩයස් කානල් නොවැම්බර් 16 සිට 27 අතර කාලයේදී ඇල්ජීරියාව, රුසියාව, තුර්කිය හා චීනය යන රටවල සංචාරක යෙදිණි. මෙම සංචාරයේදී කියුබාව හා එම රටවල් අතර ද්විපාර්ශික සබඳතා ශක්තිමත් කරගත් බවත් බලශක්තිය, ජීව තාක්ෂණික, සෞඛ්‍ය, සන්නිවේදන හා කර්මාන්ත යන ක්ෂේත්‍රයන්ද ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක සහයෝගීතාව තර කර ගත් බවත් වාර්තා වේ. සිය රුසියානු සංචාරයේදී ජනාධිපතිවරයා, කියුබානු නායක ෆිදෙල් කස්ත්‍රෝගේ පිළිරුවක් නිරාවරණය කිරීමටද එක්විය.

## යුරෝපය: බලශක්ති අර්බුදයෙන් බැටකමින්



ප්‍රංශ-ස්විස්ටර්ලන්ත දේශ සීමාවේ පිහිටා ඇති විශාල අංශු ත්වරණකාරකයක් වන Large Hadron Collider ලෙස හඳුන්වන පර්යේෂණාගාරයටද යුරෝපයේ බලශක්ති අර්බුදය බලපා තිබේ. යුක්රේන යුද්ධය හේතුවෙන් යුරෝපය තුළ දැවැන්ත බලශක්ති අර්බුදයක් මතු වී ඇති අතර ඊට මුහුණ දීම සඳහා යුරෝපා සංගමය ඉදිරි කාලය සඳහා ඉන්ධන භාවිතය 15% කින් අඩු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව මේ ශීත ඍතුව තුළදී මෙම පර්යේෂණාගාරයේ වැඩ කටයුතු තාවකාලිකව නැවැත්වීමට න්‍යෂ්ටික පර්යේෂණ සඳහා වූ යුරෝපීය සංවිධානය තීරණය කර තිබේ.

## එක්සත් ජනපදය: ඔත්තු බලතැයි බියෙන් චීන සමාගම්වලට සම්බාධක



එක්සත් ජනපදය විසින් තම රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් යයි සඳහන් කරමින් චීනයේ විශාලතම සන්නිවේදන උපකරණ නිෂ්පාදන සමාගම් කිහිපයකට එරෙහිව සම්බාධක පනවනු ලැබ තිබේ. ඒ අනුව චීනයේ Huawei, ZTE සමාගම්ද ඔත්තු බැලීමේ උපකරණ නිපදවන Dahua Technology, Hangzhoun Hikvision Digital Technology යන සමාගම්ද Hytero Communication සමාගමද සම්බාධකවලට ලක් වී තිබේ.

# ත්‍රෛලෝකවිජයපත්‍ර අයවැය විසඳයිද ජනතා ප්‍රශ්න?

රනිල් වික්‍රමසිංහ, රාජපක්ෂ පවුල් පාලනය විසින් ලංකාවේ 77වැනි අයවැය ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ අයවැය මේ වනවිට විවාදයට ලක්කෙරෙමින් තිබේ. පසුගිය කලාපයේ ආර්ථික විග්‍රහය තුළ "අයවැයට පෙරවදනක්" පළ විය. අයවැය ඉදිරිපත් කරන මොහොත වනවිට රටේ පවතින ආර්ථික අර්බුදයේ ස්වභාවය විග්‍රහ කරන ලදී.

දැන් අයවැය ඉදිරිපත් වී අවසන්ය. රටක අයවැය ඉදිරි වසර සඳහා ආණ්ඩුව වියදම් පියවා ගන්නා ආදායම උපයන ආකාරය පිළිබඳ කරන දර්ශකයයි. ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තිය හා පිස්කල් ප්‍රතිපත්තිය එකිනෙක සම්මුඛ වන ලේඛනය අයවැය ලේඛනයයි. ආණ්ඩුවට අවශ්‍ය මූල්‍ය සම්පාදනය කර ගැනීම මහ බැංකුව මගින්ද එම මූල්‍ය රටේ ජනගහනයේ අවශ්‍යතා සපුරන ලෙස ප්‍රමුඛතා සහිතව වියදම කිරීම භාණ්ඩාගාරය මගින්ද සිදුකරයි.

අයවැය දේශපාලන පක්ෂයක හෝ පුද්ගලයකුගේ පාපෝච්චාරණයක් හෝ පුරාජේරු වාර්තාවක් නොවේ. නමුත් මෙවර අයවැය කථාවේ හරි අඩක්ම රනිල් වික්‍රමසිංහ සිදුකළේ ඔවුන් විසින්ම සිදුකළ පාලනයන්ගේ ඉතිහාස වැරදි පිළිබඳව පාපෝච්චාරණයක් කිරීමටයි. ඒ පාපෝච්චාරණයේ සාරාංශය වන්නේ මේ රටට වැරදුණාද වැරැද්දුවාද කියාවත් ඔවුන්ට තේරුම් ගත නොහැකි බව වැමැරීමයි. ඒ ගැන සාකච්ඡාවකට කාලය වැයකිරීම අපරාධයකි. රට වත්මන් තත්වයට ඇද දැමුවේ ඔවුන් පුද්ගලයින් ලෙස සිදුකළ වැරදි මෙන්ම ඔවුන් විසින් අනුගමනය කළ නව යටත්විජිත ආර්ථික දේශපාලන ප්‍රතිපත්ති නිසා බව දැන් කාටත් පැහැදිලිය. ඔවුන්ද එය පිළිගනිමින් යළි යළිත් සිදු කරමින් ඉන්නේ එම වරදම බව අයවැය යෝජනා මගින්ම මෙවරද තහවුරු කරනු ලැබ ඇත.

## අයවැය මිත්‍යාව හා යථාර්ථය

රනිල් වික්‍රමසිංහගේ අයවැය මගිනුත්, මාධ්‍යයට හා ජනතාවට විහිළු සපයන යෝජනා ප්‍රමාණයක්ද ඉදිරිපත් කරමින්, නමුත් සුපුරුදු ලෙසම මහජනතාව රැවටීමට ලක් කිරීමට හා පවතින අර්බුදය යට ගැසීමට ඉතා පහත් ලෙස ක්‍රියාකර ඇත. අයවැය ලේඛනය අනුව, 2023 වසරේ අයවැය හිඟය රු. බිලියන 2404කි. එය ආණ්ඩුවේ ඉලක්කම් අනුව දළ දේශීය නිෂ්පාදිතයෙන් 7.9%කි. 2021දී ඍණ 11.6%ක් වූ වසර දෙකක් ඇතුළත ඍණ 7.9%ට අඩු කිරීමට රනිල්ගේ ත්‍රෛලෝකවිජයපත්‍ර අයවැය බලාපොරොත්තු වේ. ඒ අනුව ආදායම හා වියදම




ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව 2023 වසරේ මුළු වියදම රු. කෝටි පන්ලක්ෂ අසූ එක් දහසක් (රු. බිලියන 5819ක්ද) ආදායම රු. කෝටි තුන් ලක්ෂ හතළිස් එක්දහසක් (රු. බිලියන 3415) වෙයි.

## ඍණ 7.9% හිඟයේ අවුල

රු. බිලියන 2404ක් යනු දළ දේශීය නිෂ්පාදනයෙන් 7.9%කට (ඍණ) සමාන අගයකි. ඒ අනුව 2023දී ප්‍රතිශත අනුව දළ දේශීය නිෂ්පාදනය ගණන් හදා ගත හැකිය. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය 2023දී, රු. බිලියන 30,430ක් වනු ඇත. ලෝක බැංකු, මූල්‍ය අරමුදල ඇතුළු සියලු මූල්‍ය ආයතන පුරෝකථනයන් අනුව 2022 හා සමානවම 2023දීද ආර්ථික වර්ධන වේගය ඍණ වේයයි ගණන් බලා ඇත. නමුත් මේ අයවැය අනුව දළ දේශීය නිෂ්පාදනය දැන් පවතින මට්ටමට වඩා දෙගුණයක් වේ යැයි ගණනය කරනු ලැබ ඇත! රුපියල්වලින් ගණනයේදී උද්ධමනය නිසා අගය ඉහළ යා හැකි යැයි තර්ක කරන කෙනෙකුට මෙම අගයන් ඩොලර්වලට පෙරළා ගත්තද උත්තරය එකමය.

අප රටක් ලෙස ඩොලර් බිලියන 86ක පමණ දළ දේශීය නිෂ්පාදනයක් හිමිව පැවතිණි. එය මේ වසරේදී බිලියන 60-65 අතර ප්‍රමාණයකට අඩුවේ යැයි ජාත්‍යන්තර විශ්ලේකයින්ද විග්‍රහ කර ඇත. නමුත් රනිල්ගේ ත්‍රෛයිලෝකවිජයපත්‍ර අයවැය අනුව, 2023දී දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 83ක් පමණ වනු ඇත!

## අයවැය හිඟය පියවන අර්බුදය

මෙවර අයවැය ඉදිරිපත් කරන, අයවැය හිඟය පැවතිය හැක්කේ දළ දේශීය නිෂ්පාදනය පසුගිය වසරට වඩා දෙගුණයක් වේ යැයි උපකල්පනය මත බව දැන් පැහැදිලිය. එය පවතින යථාර්ථය යටතේ විය නොහැක්කකි. එසේ වේ යැයි සිතුවද, ඊළඟට පැන නගින අර්බුදය වන්නේ එම හිඟය පියවන ක්‍රමයයි. මෙම රු. බිලියන 2404ක හිඟය පියවීමට ආණ්ඩුව රු. බිලියන 1000ක් (හිඟයෙන් අඩක්) අපේක්ෂා කරන්නේ විදේශීය ණය ගැනීම මගිනි. එය වර්තමාන ඩොලරය හුවමාරු වන රුපියල් අගය රු. 365ක් යැයි උපකල්පනය කළ විට ඩොලර් ලෙස 2023 වසර තුළදී පමණක් අපේක්ෂිත විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 2.73කි. දැනට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා දීමට එකඟ ඩොලර් බිලියන 2.9 ලබා ගැනීමට දැනටත් වසරකට වඩා සාකච්ජාය. ලබන වසරේ මාර්තුවලදීත් එයින් පළමු වාරිකය වන ඩොලර් මිලියන 354ක් පමණ ලැබෙයැයි අඩමානය. දැනටමත් ලංකාව ණය හා පොලී වාරික නොගෙවන ලැයිස්තුවට ඇතුළත්ය. ඒ නිසා මේ රු. බිලියන 1000ක් සමාන විදේශ මුදල් ලබා ගැනීමට ඇති හැකියාව ඉතාම අඩමානය. එසේ එම විදේශ ණය මගින් අයවැය හිඟයේ කොටස පියවා ගැනීමට නොහැකි වුවහොත් ඒ ප්‍රමාණයෙන් අයවැය හිඟය විශාල වීම වැළැක්විය නොහැකිය. තවත් අවධාරණය කළ යුතු කරුණක් වන්නේ, එසේ ලබා ගන්නා ප්‍රමාණයෙන් රුපියල් බිලියන 440ක්ම ගෙවිය යුතු වන්නේ ණය වාරික ආපසු ගෙවීමටය.

> ජනතාවගේ අර්බුදයට තබා ආණ්ඩුව මේ මොහොතේ මුහුණ දෙන අර්බුදයටද මෙම අයවැය විසඳුමක් සපයා නැති බව පැහැදිලිය.
> රනිල්ගේ අයවැය මගින් කම්ටු විශාල ප්‍රමාණයක් යෝජනා කර ඇත්තේ අයවැයක් මගින් ඉටු කිරීමට නොවන බවද පැහැදිලිය. ඒ වෙනුවට ඇත්තේ 2023 ආරම්භ කර 2048 ලංකාව නිදහස ලබා වසර 100ක් පිරෙන වසරේදී සංවර්ධිත රටක් කිරීමට අලුත් යෝජනා ඇතැයි කියනු ලබන රනිල්ගේ පම්පෝරි ප්‍රකාශයකි.

එසේම මුළු වියදම්වලින් 37%ක්ම ගෙවිය යුතු වන්නේ කලින් ගත් ණය පොලිය ගෙවීමටය. රාජ්‍ය ණය ගැනීම හැර මුළු ලැබීම රු. බිලියන 3456 වන විට ණය ආපසු ගෙවීමද ඇතුළත් කළ පසු මුළු රජයේ වියදම රු. බිලියන 7871කි.

සාරාංශ ගත පැහැදිලි කිරීම වන්නේ ආණ්ඩුව අති දැවැන්ත වියදම ඇස්තමේන්තුවක් අයවැයේ ඉදිරිපත් කළද එයින් හරි අඩකටත් වැඩි ප්‍රමාණය ණය වාරික හා පොලී ගෙවීම බවය. ආණ්ඩුවට අත්‍යාවශ්‍ය ආනයන සිදු කිරීමටත් විදේශ විනිමය ඉපයීම් දැනට නොමැති යථාර්ථය පිළිබඳව අඩු තරමේ පිළිගැනීමක් වත් මේ අයවැයේ නොමැත.


ජනතාවගේ අර්බුදයට තබා ආණ්ඩුව මේ මොහොතේ මුහුණ දෙන අර්බුදයටද මෙම අයවැය විසඳුමක් සපයා නැති බව පැහැදිලිය. රනිල්ගේ අයවැය මගින් කම්ටු විශාල ප්‍රමාණයක් යෝජනා කර ඇත්තේ අයවැයක් මගින් ඉටු කිරීමට නොවන බවද පැහැදිලිය. ඒ වෙනුවට ඇත්තේ 2023 ආරම්භ කර 2048 ලංකාව නිදහස ලබා වසර 100ක් පිරෙන වසරේදී සංවර්ධිත රටක් කිරීමට අලුත් යෝජනා ඇතැයි කියනු ලබන රනිල්ගේ පම්පෝරි ප්‍රකාශයකි.

## මූල්‍ය සම්පාදනය

දැනටමත් විදේශ ණය ලැබීම නතර කර ඇති අතර ආණ්ඩුවේ දෛනික කටයුතු සඳහා මුදල් සම්පාදනය කර ගනු ලබන්නේ ඉහළ පොලී අනුපාත යටතේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර නිකුත් කිරීමෙනි. ඒ මගින් ආණ්ඩුව බැංකු පද්ධතිය සතු මුදල් ආණ්ඩුව වෙත ලබා ගන්නා අතර ආර්ථිකයේ නිෂ්පාදන, කර්මාන්ත, වගා කටයුතු සඳහා ජනතාවට ණය ලබා ගැනීමට ඇති හැකියාව මුළුමනින්ම අහුරා ඇත. 33% පමණ ඉහළ පොලී අනුපාත යටතේ ආණ්ඩුව මිලදී ගන්නේද අලුත් බැඳුම්කර නිකුතුන්ට අමතරව කල්පිරෙන බැඳුම්කරයන්ය. ඒ අනුවද පෙනී යන්නේ ආණ්ඩුවට ඉදිරියටත් ලබා ගන්නා ණය, බැංකු හා මූල්‍ය ආයතනවලට ගෙවා පියවීමේ වැඩපිළිවෙළක් නොමැති බවයි.

ආර්ථික බංකොලොත්භාවයේ පතුලටම ඇද දමා ඇති ශ්‍රී ලංකා දේශය ණය උගුලක හිරකළ ආණ්ඩුව ඊළඟට සැරසෙන්නේ තම පැවැත්ම සඳහා මූල්‍ය හා බැංකු පද්ධතිය බිල්ලට දීමටය.

රනිල්ගේ විහිළු තර්ජනවලින් හෝ සංචාරක ඇමතිනියගේ විහිළු යෝජනාවලින් ලංකාවේ ආර්ථික අර්බුදයට විසඳුම් නැති බව සුපුරුදු ලෙස මෙවර අයවැය මගින්ද ඔප්පු කර හමාරය. 77 වසරක අයවැය, 74 වසරක දේශපාලන ආර්ථික අර්බුදයට විසඳුම් ඉදිරිපත් නොකරන අතරම දැන් අවශ්‍ය වන්නේ මුළු ආර්ථික දේහයටම පැහැදිලි පිළිතුරු සොයන දැක්මක් දිනවීම බව පැහැදිලිය.



අත සංකේන්ද්‍රණ ගතවූ නිෂ්පාදන මාධ්‍යයන් අතරත්, අනිත් අතින් ස්වකීය ශ්‍රම ශක්තිය හැරුණු විට, අන් කිසිවක් නැති නිෂ්පාදකයින් අතරත් අති විශාල බිඳීමක් ඇතිවිය. සමාජයීය නිෂ්පාදනය සහ ධනවාදී අයත්කර ගැනීම අතර ප්‍රතිවිරෝධීතාවය නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර ප්‍රතිඝතීතතාවය ලෙස ප්‍රකාශ විය."

**එංගල්ස්**

**සමාජවාදය මනෝරාජ්‍යයෙන් විද්‍යාව දක්වා, 37 පිටුව**



# කැකුළු තැළීම

අවුරුදු එකහමාරක කිරිකැටි දරුවෙකු මහල් නිවාසයක තුන්වැනි මහලින් බිමට විසිකර මරා දමනු ලබ තිබේ. අයිස් මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ මාමා කෙනෙකු විසින් මෙම අපරාධය සිදුකර ඇතැයි පැවසේ. සමාජයට පිළිලයක් වන මත්ද්‍රව්‍ය දැන් වේගයෙන් සමාජය පුරා පතුරුවා තරුණ තරුණියන්, වැඩිහිටියන් හා පාසල් සිසුන් ගොදුරු කර ගනිමින් හිඳී.

පසුගිය දිනවල පාසල් ඉදිරිපිට පොලීසිය සිසුන්ගේ පාසල් බෑග් තුළ මත්ද්‍රව්‍ය ඇතිදැයි පරීක්ෂා කර සිසුන් දැඩි පීඩාවකට පත්කර තිබුණි. මත්ද්‍රව්‍ය සමාජයට එන මූලයන් විනාශ නොකොට මෙයින් මත්ද්‍රව්‍ය සමාජයේ පැතිර යාම වළකින්නේ නැත. එහි අවසාන ප්‍රතිඵලය වන්නේ පාසල් වියේ දරුවන් පවා තව තවත් මේ බියකරු ප්‍රපාතයට ඇද වැටීමේ අනතුර ඉහළ යාමයි. මේ හේතුවෙන් තව තවත් දුක් ගිනි උහුලන්නට මේ රටේ මව්වරුන්ට හා කාන්තාවන්ට සිදුවීමයි.

දැන් පාසල් උපකරණ අහස උසට ඉහළ ගොසිනි. දරුවන් ක්‍රමානුකූලව අධ්‍යාපනයෙන් පිටමං වන ලකුණු පෙනෙන්නට තිබේ. දරුවන් අගාධයට යනු දැක දැක ගිහින් සිතින් මැරි මැරී උපදින මවුවරුන්ගේ ශෝකාලාපය සතර දෙසින් අසන්නට ලැබේ. මේ තත්වය නැවැත්විය යුතු නොවේද?

ඔක්කොම කුණු බේරුවල් බොක්කට යැයි කියමනක් තිබේ. අත්තනෝමතික දේශපාලන හා ආර්ථික තීරණ, අයහපත් ලෙස සමාජ සංස්කෘතියට බලපෑම් එල්ල කරමින් හිඳින මොහොතක එම අර්බුදයේ බලපෑම වඩාත්ම උග්‍ර ලෙස එල්ල වන්නේ කාන්තාවන් සහ ළමුන් මතය. මේ තත්වය තුළ කාන්තාවගේ ආර්ථික සුරක්ෂිතතාව මෙන්ම ආර්ථික ස්වාධීනත්වයටද හානි වී ඇතිවා පමණක් නොව කාන්තාවන් හා ළමුන්ගේ නිදහස හා සමාජයීය ජීවිතයද සම්පූර්ණයෙන්ම පාහේ අහිමි වෙමින් යනු දැකිය හැකිය. ආර්ථිකය නිසා දැඩිව බැටකන ගැහැනුන් හා ළමුන් තවත් විටෙක, කාන්තාවන් හා ළමුන්ය යන සාධකය මතද පීඩාවට ලක්වන බව වර්තමානයේ පෙනේනනට තිබේ. වර්තමානය වන විට ළමා හිංසනය හා කාන්තා හිංසනය පිළිබඳ නිරතුරුව අසන්නට ලැබෙන්නේ මේ තත්වය හේතුවෙනි. සියලු දෙනාම මේ නරුම සමාජ ක්‍රමයේ වින්දිතයන් බවට පත්වී ඇත. නූපන් දරුවන් පවා මෙහි කොටස්කරුවන් වෙමින් හිඳීම ශෝකජනක තත්වයකි. ළමා අපයෝජන ඉතා ඉහළ මට්ටමකට පත්වීම මෙන්ම ළමා හිංසනයද ශීඝ්‍ර ලෙස ඉහළ යාමක් දක්නට ලැබෙන්නේ සමාජ ආර්ථික පීඩනය තුළ තම ආසන්නතම හා පහසු ගොදුර දරුවා බවට පත්වීමෙනි. කවර වාතාවරණයක් මත වුවද ළමා හා කාන්තා හිංසනය අප අනුමත කරන්නේ නැත. නමුත් පවුල තුළ මෙන්ම එයින් පිටත සමාජයේත් පිළිබිඹු වන්නේ මේ ජරාජීර්ණ සමාජයේම පැතිකඩකි. එබැවින් පවුල තුළත් පාසල්, කාර්යාල, වැඩ බිම් හා ගොවි බිම් තුළත් ළමයින් හා කාන්තාවන් හිංසනයට ලක්වීම නොවැළැක්විය හැකි මට්ටමකට පත්වෙමින් තිබේ. දරුවාට අධ්‍යාපනය මෙන්ම රැකවරණයද ලැබිය යුතු පාසල තුළ ස්ථානීය දෙමාපියන් ලෙස හඳුන්වන ගුරුවරුන් විදුහල්පතිවරුන් විසින්ම දරුවන්ට හිංසා පීඩා කිරීමත් ඒ සඳහා නීති උපකාර ලබාගැනීමත් බහුලව දක්නට ලැබේ. පසුගිය දිනක හොරණ මිල්ලනිය ප්‍රදේශයේ පාසලක විදුහල්පතිනිය විසින්ම පොලීසිය කැඳවා දරුවන්ට පහරදීම මෙයට හොඳම උදාහරණයකි. එයට හේතුව ලෙස සැලකෙන්නේ ගුරුවරියකගේ මුදල් පසුම්බිය සොරාගත් බවට සැකයකි. දරුවා එසේ සොරකම් කළා නම් එයට හේතුව සොයා බලා ඊට පිළියම් යොදනු වෙනුවට හිංසනය තුළින් පිළිතුරු සෙවීමෙන් අවසාන ප්‍රතිඵලය වූයේ විදුහල්පතිනියට රක්ෂිත බන්ධනාගාරගත වන්නට සිදුවීමයි. මෙය කිසිසේත් ශිෂ්ට සම්පන්න සමාජයක සිදුවිය යුතු දෙයක්ද නොවේ.

මෙවැනිම කතා ලංකාවේ සතර දිග් භාගයෙන් මේ වන විට අසන්නට ලැබේ. ඒ තුළින් දරුවන් මෙන්ම කාන්තාවන්ද හිංසනයට පත්වන ආකාරය පැහැදිලිව දැකගත හැකිවේ. පසුගිය දිනක දක්නට ලැබුණු පුවතක සඳහන් වූයේ දුම්මලසූරිය ප්‍රදේශයේ පොලිස් හා ළමා හා කාන්තා කාර්යාංශයක ස්ථානාධිපතිවරියකගේ දියණිය, ස්ථානාධිපතිවරියගේ අනියම් සැමියා අතින් දූෂණයට ලක්ව ඇති බවයි.

මේ අයුරින් ළමයින් හා කාන්තාවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පවතින ආයතන තුළ පවා මෙවැනි සිදුවීම් සිදුවෙනවා නම්, සමාජයේ අනිත් ස්ථානවල සිදුවන තත්වයන් ගැන කවර කතාද?

විරෝධතා පුවරු දෙකක් රැගෙන පා ගමනින් ගමන් කළ කාන්තාවන් දෙදෙනෙකුට බාධා කර, අත්අඩංගුවට ගන්නා පොලිස් නිලධාරීන් අපි පසුගිය දිනක දුටුවෙමු. දැන් කාන්තාවන්ට මහමග පයින් ගමන් කිරීමට වත් නොහැකි තත්වයක් උදාවී තිබේ. එක් පසෙකින් මුදල් පසුම්බිය, චේන් එක සොරා ගන්නා සොරුන්ගෙන් බේරෙන්නට නොහැකිය. අනෙක් පසින් පොලීසියෙන් බේරෙන්නට බැරිය. පාර්ලිමේන්තුවේදී කතාවක් කරමින් රටේ ජනාධිපතිවරයා පවසන්නේද අදාළ ආයතනවලින් අවසර ගෙන පා ගමන් විරෝධතා සිදුකරන ලෙසයි. මේ පයින් යන අවස්ථාවේ පොලිස් නිලධාරීන් විසින් තම කනිෂ්ඨ නිලධාරිනියන්ගේ බෙල්ලෙන් අල්ලා හිංසා කරන අයුරුද අපි දුටුවෙමු. මේ ආකාරයට ඉහළ නිලධාරීන් අතින් පහළ කාන්තා නිලධාරිනියන් හිංසාවට පීඩාවට ලක්වෙන බව අපි වර්තමානයේ වඩාත් හොඳින් අත්විඳිමින් හිඳිමු.

නමුත් සුපුරුදු ලෙස මෙම කාන්තා නිලධාරිනිය පවසා තිබුණේ තමන්ට එය හිංසාවක් නොවූ බවයි. ඇතැම් විටෙක එය තමන්ගේ රැකියාව ආරක්ෂා කර ගැනීම සඳහා කියූ කතාවක් විය හැකිය. එසේත් නැත්නම් බිය හෝ එරෙහි වීමට දක්වන මැලිකම හෝ යටත් මානසිකත්වය නිසා හෝ සිදුවූවක් විය හැකිය. කෙසේ නමුත් මේ සියලු දේවල් සිදුවන්නේ කාන්තාවන්ට සහ ළමුන්ට බව අපි නැවතත් අවධාරණය කරමු.

මේ සා විශාල සමාජ අර්බුදයක් මැද රටේ ජනාධිපති ජනතාවට පෙනෙන්නට හිට්ලර්ට අඳින්නට සැරසී ඇත. එය හරියට නිල් බාල්දියට වැටුණු නරියාගේ කතාවට සමානය. තීන්ත ගෑවුණද නරියා හඬින් හඳුනාගත හැක. නරි හූවට බියවීමට සිංහයන් සූදානම් නැති බව පාලකයන්ට ඒත්තු ගැන්විය හැකි ප්‍රබල කණ්ඩායම කාන්තාවන්ය.

අද වන විට සතර අතින් ගෙල සිරකර ඇත්තේ කාන්තාවන්ගේ හා ළමුන්ගේය. ළමයින් නිසාද නැවත පීඩා විඳින්නේ කාන්තාවන්මය. එබැවින් මේ සිරවූ තොණ්ඩුව ගලවා ගත හැක්කේද කාන්තාවන්ටම බව, අවධාරණය කර ගත යුතු වකවානුවක අපි ජීවත් වන බව මතකයේ තබාගනිමින් ඒ අනුව ක්‍රියාත්මක වීමට පෙළගැසෙමු.



## පුබුදවනු මල් නුඹේ තුරුල්ලේ

බොඳ නොවුණු හීන සිතුවම් කළ
සොඳුරු කොඳ කැකුළු
සරතැසට ගිනි වැදුණු පොළොවක
කාෂ්ටක වන අයුරු

බඩසයින් වැටුණු මුතු කඳුළු
ඉවතලන මඟක් ළඟ නොදුටු
කේඩෑරි පපු කුහර කොනිත්තා
මව්වරුන් ළය නිතර ඇවිළු

දරු දුකින් හඬන ඉරිලේනියට
මහසයුර දිය බිඳක් පමණකිය
සිඟිත්තන් රකින්නට නොබියව
පෙරමුණේ රොද බඳිමු විගසින

නියං සායට හසුව මුළුල්ලේ
මී පුප්ය මිලින කළ නිදැල්ලේ
සුසුම් ලන මව් කොබයි කිරිල්ලේ
පුබුදවනු මල් නුඹේ තුරුල්ලේ

## ඉරානයේ කාන්තා අරගලය

සිව් දෙසින්




මාසා අමීනි නම් තරුණිය පොලිස් භාරයේ සිටියෙදී මිය යාමත් සමග ඉරානයේ ඇතිවූ අරගල රැල්ල මේ වන විට මාස දෙකක කාලයක් පසු කර ඇත. ඇයගේ මරණය මූලික හේතුවක් කරගෙන මෙම අරගල ආරම්භ වුවද පසුව එය ජාතික අරගලයක මට්ටමට පරිණාමය විය. මූලික වශයෙන් කාන්තාවන්ගේ සහ තරුණ ප්‍රජාවේ නායකත්වය මෙම අරගලයේ ප්‍රධාන ලක්ෂණයක් විය. 'ස්ත්‍රිය, ජීවිතය, විමුක්තිය' අරගලයේ ප්‍රධාන තේමා පාඨය බවට පත්විය. ආරක්ෂක අංශ විසින් සිදුකළ සහ සිදුකරනු ලබන මර්දනය හමුවේ සියගණනකගේ ජීවිත අහිමි වුවද අරගලයේ තීව්‍රතාවය වැඩිවනු මිස අඩුවීමක් දක්නට නොලැබෙන බව විදේශ මාධ්‍ය වාර්තා කරයි.

1979 ඉස්ලාමීය ජනරජය පිහිටවීමේ පටන්ම ඉරානයේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් වැඩි ප්‍රතිශතයකින් කප්පාදුවට ලක්විය. පෙරදී ඉරාන කාන්තාවන් විසින් ප්‍රතිසංස්කරණවාදී දේශපාලනඥයින් වෙනුවෙන් පෙනී සිටිමින් සිය අයිතිවාසිකම් දිනා ගැනීමට උත්සාහ කළද ඒවා ඵල රහිත විය. කාන්තාවන් විසින් මූලික වශයෙන් ආරම්භ කරන ලද අරගලයක් ඉරානය තුළ මේ තරම් කාලයක් පවත්වාගෙන යාම පෙරදී නම් පුරෝකථනය කළ නොහැකි තත්වයක්ව පැවතුණි. නමුත් එම තත්ත්වය වෙනස් කිරීමට වත්මන් අරගලය සමත්ව ඇත. මේසා විශාල සහ පැතිරුණු අරගලයක් ඉරානයේ මේ දක්වා පැන නැගී නැති බවටද විචාරකයෝ අදහස් දක්වති. කාන්තාවන් පමණක් නොව පිරිමින්ගේද සහභාගිත්වය සහිතව වර්ධනය වන ඉරාන ජනතාවගේ මෙම අරගලය ජයග්‍රහණය කරා ළං වීම ලොව පුරා ප්‍රගතිශීලී ජනතාවගේ අපේක්ෂාවයි.

## මවුවරුන්ගේ විරෝධතාවය




පසුගිය ඔක්තෝම්බර් 29 වනදා එක්සත් රාජධානියේ ට්‍රැෆල්ගර් චතුරස්‍රයට ඒකරාශී වූ දහස් ගණනක් කාන්තාවන් විශේෂයෙන් මවුවරුන් විරෝධතාවය පළකරමින් ප්‍රකාශ කළේ එරට දරුවන් රැකබලා ගැනීමේ ක්‍රමවේද විසින් දෙමාපියන්ද, දරුවන්ද, සමස්ත රටද පසුබෑමකට ලක් කර ඇති බවයි. මේ වන විට ලන්ඩන් නගරයේ දරුවන් හදා වඩා ගැනීම, පෝෂණය කිරීම සහ ළදරු පාසල් සහ පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට යැවීම දරාගත නොහැකි වියදමක් බවට පත්වී ඇති බව විරෝධතාවයට සම්බන්ධ වූ මවුවරු පෙන්වා දෙති. විරෝධතාකරුවන් ප්‍රකාශ කරන ආකාරයට ආණ්ඩුව විසින් දෙමව්පියන් සහ දරුවන් සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යාවශ්‍යව පවතී. එසේම දරුවන් රැක බලාගන්නා දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ගාස්තු වැඩි වීම හේතුවෙන් බොහෝ අවස්ථාවලදී මවුවරුන්ට සිය වෘත්තිය අභිවෘද්ධිය අමතක කොට දරුවන් සමග නිවසේ රැඳී සිටීමටද සමහර අවස්ථාවලදී අඩු වේතනවලට අර්ධ කාලීන රැකියාවන්හි නිරත වීමටද සිදුවේ. එක්සත් රාජධානිය යනු දරුවන් වෙනුවෙන් අධික ලෙස වියදම් කිරීමට සිදුවන රටවල් අතරින් එකකි. වැඩිවන උද්ධමනය හේතුවෙන් දෙමව්පියන් මත වන පීඩනය තවදුරටත් වර්ධනය වී ඇත. මෙම ස්ථානයේ පමණක් නොව එක්සත් රාජධානියේ තවත් බොහෝ නගරවලද මෙලෙස මවුවරුන්ගේ විරෝධතා පෙළපාලි නිරීක්ෂණය කළ හැකිව තිබේ.

# සංස්කෘතිය සිරගෙයක්ද?



සාරිය

සමාජයක, සංස්කෘතිය යනු එකම තැන පල්වෙන දෙයක් නොව කාලානුරූපව විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් ඉදිරියට යන දෙයකි. මානව සංස්කෘතිය හැමවිටකම වෙනස්වී තිබෙන අතර ඒ වෙනස්වන සෑම විටකම ඊට ප්‍රතිවිරෝධයන්ද ඊට එරෙහි මතයන්ද තිබී ඇත. එහෙත් එම ප්‍රතිවිරෝධතා අතරම සංස්කෘතිය වෙනස්කම්වලට භාජනය වෙමින් අලුත් වෙමින් ඉදිරියට ගමන් කරමින් තිබේ.

මානව සංස්කෘතිය ඉදිරියට ගමන් කරන්නේ පැරණි සංස්කෘතික වටිනාකම් හා සංස්කාතික ලක්ෂණ මුළුමනින්ම අහෝසි කරමින් නොවේ. එසේම සංස්කෘතියට අලුත් දේ එකතු නොකර ගනිමින්ද නොවේ. සංස්කෘතිය ගමන් කරන්නේ අතීත සංස්කෘතික වටිනාකම් හා සමහර ලක්ෂණ රැකගනිමින්, වර්ධනය කරමින් හා අලුත් සංස්කෘතික වටිනාකම් හා ලක්ෂණ එකතුකර ගනිමිනි. එහිදී නොගැලපෙන සමහර සංස්කෘතික ලක්ෂණ අභාවයට යන අතර සමහරවිට වර්තමානයට නොගැලපෙන ලක්ෂණ දිගුකලක් පවතින තත්වයන්ද තිබේ. එය එසේය. මන්ද සංස්කෘතිය යනු සංකීර්ණ ප්‍රපංචයක් වන බැවිනි.

සංස්කෘතිය පිළිබඳ ඉහත පැහැදිලි කිරීමෙන් මෙම ලිපිය ආරම්භ කිරීමට අපට සිතුණේ පසුගිය දිනවල ලංකාවේ ගුරුවරියන්ගේ 'සාරිය' පිළිබඳ මතුවූ සංවාදය නිසාය.

මෙම ලිපියේ අරමුණ ගුරුවරියන්ට සාරිය අනිවාර්ය කිරීම හෝ සාරිය ප්‍රතික්ෂේප කිරීම නොවේ. එය අපට අයත් කාර්යයක් යැයි අපි නොසිතමු. මේ පිළිබඳ අවසන් තීරණයක් ගත යුත්තේ ගුරුවරියනුත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අදාළ බලධාරීනුත් අතර කර ගන්නා අවංක සංවාදයකින්, යථාර්ථවාදී ප්‍රවේශයකින් යැයි අපි සිතමු. එහෙත් සාරිය පිළිබඳ සංවාදයේ පැවති සමහර අවිද්‍යාත්මක ප්‍රවේශයන් පිළිබඳ යමක් සඳහන් කළ යුතු යැයි අපි සිතමු. මේ සටහන ඒ වෙනුවෙනි.

## ඇඳුම් කුමට ද?

මේ වන විට 'ඇඳුම' විලිවසා ගැනීමේ, ශරීරය බාහිර පරිසර තත්වයන්ගෙන් ආරක්ෂාකර ගැනීමේ සීමාවෙන් ඔබ්බට ගිය සංස්කෘතික දෙයක් බවටද පත්ව තිබේ. විවිධ ඇඳුම් වර්ග, විවිධ විලාසිතා, විවිධ වර්ණ ආදිය විසින් තහවුරු කරන්නේ 'ඇඳුම' දැන් සංස්කෘතික කරුණක්ද වන බවය. සත්‍යය එයයි. එහෙත් ඉන් මිනිසාට ඇඳුමක් අවශ්‍ය වූ මූලික හේතු වන පරිසර සාධකවලින් සිරුර ආරක්ෂා කර ගැනීමේ හා පසුව සදාචාරමය හේතුවක් වූ විලිවසා ගැනීමේ අවශ්‍යතාවය අහෝසි වන්නේ නැත. (නූතනයේ සමහර විලාසිතා එම මූලික අවශ්‍යතා නොලසකා තිබෙන බව වෙනම කරුණකි)

මානව පරිණාමයේ එක්තරා වකවානුවක මිනිසා සිරුර වසා ගැනීමට උත්සාහ කළේ 'සදාචාරමය' හේතුවක් නිසා නොවන බව මානව ඉතිහාසය පිළිබඳ ගවේෂණය කළ අය පිළිගෙන තිබේ. පළමුවෙන්ම ඔහුට අවශ්‍ය වූයේ සොබාදහම තුළ පරිසරයේ බලපෑමෙන් තම සිරුර රැකගැනීමය. ශීත ප්‍රදේශවලට සංක්‍රමණය වූ ආදී මානවයාට සීතලෙන් තම සිරුර ආරක්ෂා කර ගැනීම අභියෝගයක් විය. ඒ අනුව ඔහු තම සිරුර ආවරණය කර ගැනීමට සතෙකුගේ හමක් හෝ ගසක පොතු හෝ කොළ අතු යොදා ගත්හ.

වර්තමාන 'ඇඳුම්' දක්වා වර්ධනය වූයේ එයයි. පසුව විලිවසා ගැනිමේ අදහසද මෙයට එකතු වූ බව පෙනේ. වර්තමානය වන විට ඇඳුමේ ප්‍රධාන අවශ්‍යතාවය ලස්සනට සිටීම හෙවත් විලාසිතාවක් දක්වා විකාශනය වී තිබේ. මේ අනුව ලොවපුරා ජනතාව ගැහැනු, පිරිමි විවිධ වර්ගයේ විවිධ වර්ණයේ විවිධ විලාසිතා හා මෝස්තරවලට අනුව සැකසූ ඇඳුම් අඳිති. ඒ අනුව සමහර රැකියාවන් හා සමහර වෘත්තීන් සඳහා මිනිසා 'නිල' ඇඳුමක්ද නිර්මාණය කර ගෙන තිබේ. භික්ෂූන් වහන්සේලා හා පූජකතුමන්ලාගේ ඇඳුම හමුදා පොලීසි ඇඳුම ඊට එක් උදාහරණයකි.

## ඊනියා සදාචාරය හා සාරිය

මෑතදී අපේ රටේ මතුවූ ගුරුවරියන්ගේ සාරිය පිළිබඳ සංවාදයේදී සමහරු එයට කඩා පැන්නේ සදාචාරවාදී ප්‍රවේශයකිනි. ගුරුවරියන් දරුවන්ට උගන්වන බැවින් ආදර්ශමත් විය යුතු බවත් 'ඇඳුම' සදාචාර සම්පන්න විය යුතු බවත් ගුරුවරියන් ශරීරය නිරාවරණය නොවන සේ සිරුර වැසෙන ඇඳුමක් ඇඳිය යුතු බවත් ආදී තර්ක රැසක් මතුකරන ලදී.

එහෙත් සැබැවින්ම එම තර්ක විද්‍යාත්මක තර්ක නොවේ. ගුරුවරියන්ට සාරිය අනිවාර්ය කිරීමට බල කරන ඇතැමුන්ගේ තර්කය වන්නේ සදාචාරයට ගැලපෙන ඇඳුමක් බවත් ඉන් කාන්තාවන්ගේ සිරුර නිරාවරණය නොවන බවත්ය. එහෙත් එය ඇත්තක් නොවේ. සාරිය ඇන්ද විට කාන්තාවන්ගේ පිට ප්‍රදේශය මෙන්ම බඩ ප්‍රදේශයද නිරාවරණය වේ. මේ තර්කය මත සිතුවහොත් සාත්තු සේවිකාවන්ගේ නිල ඇඳුමද වැරදි බව කීමට සිදුවේ. ඕනෑම වෘත්තියක නියැලෙන අය ඊට ගැලපෙන සදාචාරමය වටිනාකම් රැකෙන පරිදි කටයුතු කළ යුතුය. එහෙත් එහිදී සදාචාරය හෝ සංස්කෘතිය සිරගෙයක් නොවිය යුතුය.

එහෙත් මෙහිදී සමහරු කියන්නේ ඉගෙන ගන්නේ දරුවන් නිසා ගුරුවරිය ඔවුන් ඉදිරියේ සදාචාර සම්පන්න ඇඳුමක් ඇඳිය යුතු බවය. ගුරුවරියන් ඇඳුමක් ඇඳිය යුතු බව ඇත්තය. එහෙත් සාරියෙන් පමණක් සාදාචාර සම්පන්න බව රැකිය හැකිදැයි බැලීමටද වැදගත්ය. එසේම 'සදාචාරය' රැකෙන වෙන ඇඳුම් තිබිය නොහැකිද? යන්නද අවධානයට ගත යුතුය. ඇඳුම පිළිබඳ ප්‍රශ්නයේදී එය අඳින අයගේ අදහසට අවධානය යොමු කිරීමද වැදගත්ය.

> මේ වන විට 'ඇඳුම' විලිවසා ගැනීමේ, ශරීරය බාහිර පරිසර තත්වයන්ගෙන් ආරක්ෂාකර ගැනීමේ සීමාවෙන් ඔබ්බට ගිය සංස්කෘතික දෙයක් බවටද පත්ව තිබේ. විවිධ ඇඳුම් වර්ග, විවිධ විලාසිතා, විවිධ වර්ණ ආදිය විසින් තහවුරු කරන්නේ 'ඇඳුම' දැන් සංස්කෘතික කරුණක්ද වන බවය. සත්‍යය එයයි. එහෙත් ඉන් මිනිසාට ඇඳුමක් අවශ්‍ය වූ මූලික හේතු වන පරිසර සාධකවලින් සිරුර ආරක්ෂා කර ගැනීමේ හා පසුව සදාචාරමය හේතුවක් වූ විලිවසා ගැනීමේ අවශ්‍යතාවය අහෝසි වන්නේ නැත.

## සදාචාරයේ සීමා මොනවාද?

ඇඳුම් පිළිබඳ සදාචාරය තීරණය වී ඇත්තේ එක් එක් යුගයෙන් යුගයට එක් එක් රටින් රටට වෙනස්වය. එක් එක් පාරිසරික කලාපවල, එක් එක් යුගවල 'ඇඳුම' වෙනස් ආකාරයන්ගෙන් පැවැති බව ඉතිහාසය දෙස බලනවිට පෙනේ. අතීතියේ මුළු සිරුරම වැසෙන සේ ඇඳුම් කිහිපයක්ම ඇන්දේ ශීත කලාපවල ජනතාව ශීතලෙන් ආරක්ෂා වීම සඳහාය. යුරෝපයේ කලිසම, කමිසය, ටයිපටිය, කෝට් එක, ශීත කබාය ආදී ඇඳුම් රැසක් ඒ සඳහා භාවිතා විය. මැදපෙරදිග දී තද හිරු රැසෙන් හා දූහුවිල්ලෙන් ආරක්ෂා වීමට සැහැල්ලු ලෝගුවක් වැනි ඇඳුමක් අඳින ලදී. හිස හා මුහුණද රෙදි කඩකින් ආවරණය කර ගන්නා ලදී. ඒ පාරිසරික හේතු මතය.

එහෙත් අප රට වැනි ඝර්ම කලාපීය රටවල මුළු සිරුරම වැසෙන සේ ඇඳුම් අවශ්‍ය නොවීය. අපේ රටේ අතීත ගැමියා බොහෝ විට සැරසී සිටියේ අමුඩයකිනි. කාන්තාවන් දණහිස තෙක් කෙටි රෙදිකඩක් ඇඳ සිටියේය. එකල ඇඳුමේ සදාචාරය වූයේ එයයි. ලංකාවේ අතීතයේ සාමාන්‍ය කාන්තාවන්ට හා පිරිමින්ට උඩුකය වැසීම තහනම්ව තිබුණි. එය ප්‍රභූ පවුල්වලට පමණක් අයිති වරප්‍රසාදයක් විය. කාන්තාවන් උඩුකය නිරාවරණය කරගෙන සිටීම එකල සදාචාර විරෝධී වූයේ නැත. සදාචාර හා නීති විරෝධී වූයේ උඩුකය වැසීමය. මෙය ඉන්දියාව තුළද දැකිය හැකි විය. උඩුකයට ඇඳුම් ඇඳීමට ඉඩ නොදීම පහත් කුලවලට අයත් යැයි සැලකූ ජනයා හා පීඩිතයන් පහත් තත්වයෙන්ම තබා ගැනීමේ පරපීඩක ක්‍රියාවක්ද විය.

## ඇඳුම වෙනස් වන දෙයක් ලෙස

මිනිසුන්ගේ ඓතිහාසික ගමන්මග තුළ ඔවුන් ඇඳුම් පැළඳුම් වෙනස් කරගෙන තිබේ. එබැවින් වෙනස් වීමට බිය වීම හා විරෝධය පෑම සමාජ සංවර්ධනයට බාධාකාරීය. වෙනස් වීමේදී යහපත් දෙසට වෙනස් වීම අවශ්‍ය දෙයක් බව ඇත්තය. එහෙත් වෙනස් වීමට බිය වීම නිවැරදි නැත.


ලංකාවේ ගුරුවරුන්ගේ ඇඳුම ගැන සිතන්න. අතීතයේදී ඔවුන් ඇන්දේ රෙද්ද හා බැනියමය. (ජාතික ඇඳුම) මුල් කාලයේ කලිසම කමිසය ඇන්දේ ඉංග්‍රීසි ගුරුවරයාය. එහෙත් පසුව පහසුව සඳහා සියලු ගුරුවරු කලිසමට, කමිසයට මාරුවූහ.

ඇතැම්විට අන්ධානුකරණය මෙන්ම විවිධ රටවල අය වෙනත් රටවලට සංක්‍රමණය වූ විට හෝ ආක්‍රමණය කළ විට තම සංස්කෘතික ලක්ෂණ අදාළ රටවල් තුළද ප්‍රචලිත කිරීම නිසා සංස්කෘතියේ විවිධත්වය වැඩි වී තිබේ. නොගැලපෙන ලක්ෂණද ඇති වී ඇත.

එසේම විවිධ වෘත්තීන්ගේ ඇඳුම්ද විටින් විට වෙනස් වී තිබේ. වෙනස් කර තිබේ. මෙම ප්‍රශ්නය සමහර කාලවල ක්‍රීඩාවේදීද මතුවිය. මලල ක්‍රීඩිකාවන්, දැල් පන්දු හෝ වොලිබෝල් ක්‍රීඩිකාවන් කෙටි කලිසමක් ඇඳීම ගැනද සමහර සදාචාරවාදීන් විරුද්ධ වූ අවස්ථා අප දැක තිබේ. සැබවින්ම සදාචාරය තිබිය යුත්තේ ඇඳුම තුළ පමණක්ම නොවේ. ඒ දෙස බලන අයගේ මනස තුළද සදාචාරය තිබිය යුතුය. අනෙක සදාචාරයන් පිළිබඳ මිනුම් දඬුද සදාකාලික නැත. විටින් විට වෙනස් වේ.

කාන්තාවන්ගේ ඇඳුම පිළිබඳව තලේබාන් වර්ගයේ ඇසකින් බැලීම නූතන සමාජයට ගැලපෙන්නේ නැත. පසුගිය කාලයේ මුස්ලිම් කාන්තාවන්ගේ ශරීරයම වැසෙන සේ ඇඳගත් බුර්කාවට විරුද්ධ වූ අයම ගුරුවරියන්ට ශරීරය වැසෙන සේ සාරිය අනිවාර්යය කිරීමට උපදෙස් දීම හාස්‍යජනකය.

කෙසේ වෙතත් සමාජයක විනය, සදාචාරය තිබිය යුතුය. ගුරුවරියන් ඇඳිය යුත්තේ කුමක්ද යන්න පිළිබඳ තීරණය කිරීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන බලධාරීන් හා ගුරුවරියන්ගේ සංවාදයකින් කර ගත යුතුය. එය කෙසේ වෙතත් අප උත්සාහ කළේ මේ සංවාදය තුළ පැවති සදාචාරවාදී ප්‍රවේශයකින් ආ සමහර මතවල වැරදි සහගත බව පිළිබඳ අවධානය යොමු කිරීමටය. අප ජීවත්වන්නේ වෙනස් වන ලෝකයක බවත් සදාචාරයන්, සංස්කෘතීන්ද වෙනස් වන බවත් වටහා ගැනීම කාටත් වැදගත්ය. සංස්කෘතිය යනු සිරගෙයක් නොවන බවත් සංස්කෘතික සිරගෙවල් තුළ කිසිවෙකු අමානුෂිකව සිර කළ යුතු නැති බවත් මානව සමාජය වටහා ගත යුතුය.



"වැරදීම්, ඒවා සිදුවන මොහොතේ වේදනාකාරීය. නමුත් වසර ගණනාවකට පසු එම වැරදීම්වල එකතුව අත්දැකීම් ලෙස හඳුන්වනු ලබන අතර ඒවා අපට සාර්ථකත්වය සඳහා මග පෙන්වයි."

**අබ්දුල් කලාම්**

# පොලිටිකල් පංතිය

පොලිටික්ක මේ දවස්වල උදේම ඉස්කෝලෙට එනවා, කුකුළා අතේ අරන් වගේ. හැබැයි පංතියට එන්නෙ කැන්ටිම පැත්තෙ රවුමක් ගහල. හවසටත් ආයෙත් ඒ පැත්තට යනවා. ළමයි කීපදෙනෙක් මේ වැඩේ දැකල තිබුණා.

"ගුඩ් මෝනිං සර්" පංතියට එනවත් එක්කම වසන්තිය එක දා ගත්ත.

"වෙරි ගුඩ් මෝනිං සර්" හති දාගෙන ආපු අනුරුද්දියටත් එක බැරිනම් දෙක දාගත්ත.

"ගුඩ් මෝනිං ළමයිනේ..." පොලිටික්ක ඇල්ප්ස් කන්දට නැගපු නැපෝලියන් වගේ වටපිට බැලුව.

"ඇයි සර් දැන් උදේම එන්නෙ?" කනිය ඇහුවෙ තමන්ගෙ නින්දට බාධා වීම ගැන ප්‍රශ්නයක් වුණාට ඒක කඩඉම් ප්‍රශ්නයක් වුණා.

"ගෙදර මොකුත් ප්‍රශ්නයක්ද සර්?" ඇත්ත බරපතළ ප්‍රශ්නෙ ආවෙ මංජුවගෙන්.

"ඇයි මංජුල එහෙම ඇහුවෙ?" පොලිටික්ක හැරෙන තැපෑලෙන් ඇහුව.

"නැහැ සර්... ගෙදර වර්ජනයක් පටන් අරන්ද කියල බැලුවෙ... උදේට දවල්ට කැන්ටිමෙන් කන්න වෙලා කියල හිතුවෙ" මංජුව පරිස්සමට වචන ගැලපුව.

"නෑ ළමයිනේ ගෙදර කිසි ප්‍රශ්නයක් නෑ... ඔය ළමයි හිතල තියෙන දුරක්" පොලිටික්ක හයියෙන් හිනා වුණේ පංතියෙ ඔක්කොටම කින්ඩියට වගේ. "ඔයාලා කොරහෙ කිඹුල්ලු දකිනවනෙ. දැන් ප්‍රශ්න නෑනෙ. කිවුආර් කෝඩ් එකට තෙල් ගහනව. ගෑස් ටැංකියක් හොයා ගත්තා. බඩු ටිකක් විතර ගණන් අඩුයි. ලයිට් වතුර බිලටත් දැන් හුරුයි."

"එහෙනම් සර් උදේ හවා කැන්ටිමට යන්නෙ?" මංජුව පොලිටික්කව තාප්පෙටම හේත්තු කරනව.

"කැන්ටිමේ අක්ක බලන්න..." කවුරුහරි ඕන්නැති කතාවක් කිවුව පිටිපස්සෙ පේලියකින්.

"මොකද්ද? මොකද්ද?" පොලිටික්ක ඇහුණෙ නෑ වගේ ඇඟෙව්වට මූණ රතු වුණා. "මං කැන්ටිමට යනව තමයි. ඒ ගෙදරින් ගේන වඩේ කැන්ටිමට දාන්න. හවසට යන්නෙ ඒ සල්ලි ගන්න. පඩියෙන් ජීවත් වෙන්න අමාරුයිනෙ. අමතර ගාණක් හොයන්න වෙනව" පොලිටික්ක බොක්කම දිගඇරිය.


"ඉතින් සර්ම නේද කිවුවෙ ගෙදර කිසිම ප්‍රශ්නයක් නෑ කියල. තෙල් ගෑස් ප්‍රශ්න නෑ. වැඩි වෙච්ච බිල්වලට හුරුවුණා කියල... හිනා වුණේ අපි වැරැද්දක් කළා වගේනෙ. දැන් ජීවත් වෙන්න අමාරුයි කියල කැන්ටිමට වඩේ දානව. වඩේ දාන එකේ නෙමෙයි ප්‍රශ්නෙ; දැන් කිසිම ප්‍රශ්නයක් නෑ කියල අර්බුදේට හුරු වෙන විදිහෙ. ඉස්සරහට තව අමාරු වෙනකොට කැන්ටිමට විතරක් වඩේ දාලා ගොඩයන්න බැරිවෙයි. ඉස්සරහට රස්සා බර ගාණක් නැති වෙනකොට මිනිස්සුන්ට සල්ලි නැතිව වඩේ ඉතුරු වෙන්න ගනී. එතකොට මඟ දිගට කඩවලින් අහල බලන්න වෙයි වඩේ ගන්නවද කියල. නැත්නම් ලැවරිය ටිකක් දාල බැලුවනම් හරි කියල හිතෙයි" සමන එන්න නියමිත අර්බුදෙත් එක්කම දෙසුව නිසා පොලිටික්ක වඩේ කතාව ඇකිළුව.

"නෑ ඉතින්... සංචාරකයො ටිකක් හරි එන්න පටන් ගත්තනම් ඩොලර් ටිකක් එනවනෙ. රනිල් මහත්තයත් කිවුවෙ උද්ඝෝෂණ නතර වුණානම්..." පොලිටික්ක දිව්යලෝකෙ යන්න වල්ගෙ එල්ලෙන්න බැලුව.

"ඩොලර් එන්නෙ නැත්තෙ රස්සාවලට ගිය අය ආණ්ඩුව ගැන විශ්වාසයක් නැතුව සල්ලි එවන්නෙ නැති හින්දා. මොකද රනිල් ඇවිත් ආර්ථිකය හදල ගනී කියල සිහිබුද්ධිය ඇති කවුරුවත් විශ්වාස කරන්නෙ නෑ. අනෙක මේ රටේ උද්ඝෝෂණයක් තියෙනව කියල සංචාරකයො නෑවිත් ඉන්නෙ නෑ. ලයිට් කැපෙන එක, තෙල් ප්‍රශ්න වගේ ඒවා තමයි එයාලට තියෙන ප්‍රශ්න. සංචාරකයො එන්නෙ නැතිවෙයි කියල උද්ඝෝෂණ නොකර හිටියනම් ගෝඨාභය ජනාධිපති. මහින්ද අගමැති, නාමල් ඇමති. රනිල්ට මතක නෑ එයා ආවෙ කොහොමද කියල. දැන් හිට්ලර්ට අඳින්න හදනව... කනත්ත ගාවින් යනකොට බීපු මිනිස්සු සද්දෙට කුණුහරුප කියාගෙන යන්නෙ බයට කියල ගම්වල මිනිස්සු දන්නව" සමනගෙ කතාව ඉවරවෙනකොට පොලිටික්ක නොකියම කැන්ටිම පැත්තට ගියේ තේ බොන්නද වඩේ ඉතුරු වෙලාද කියල බලන්නද කියල දන්නෙ එයාම විතරයි.

# කොමඩි රනිල්...



'ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධීන් හා පෞරුෂයන් දෙවරක් ඇතිවන බව කිවහැකියි' හෙගල් වරක් කීවේය. එහෙත් ඔහුට මෙලෙස එකතු කිරීමට අමතක විය යනුවෙන් මාක්ස් කීවේය. එනම් ඒවා ඇති වන්නේ ප්‍රථම වර ඛේදජනකයක් ලෙසත් දෙවන වර හාස්‍යජනකයක්ද ලෙසිනි'

මාක්ස් තවදුරටත් මෙසේද කීය. "මියගිය පරම්පරාවල සම්ප්‍රදායන් ජීවත්වන්නවුන්ගේ හිස් මොළය තුළ නපුරු සිහිනයක් සේ දිස්වෙයි. මිනිසුන් තමන් අවට පරිසරය මැඩගෙන මෙතෙක් නොවූවිරූ යමක් නිර්මාණය කිරීමට මෙන් ඉදිරිපත් වන මොහොතේදී මෙන්න මෙවැනි විප්ලවීය අර්බුද සහිත යුගවලදී අතීතයේ මළගිය ආත්ම තමන්ගේ ආධාර පිණිස අඬගැසීමේ මන්ත්‍ර, බියසුලු ලෙස ජපකරමින් පැරණි වෙස්මුණු බැඳගෙන, පැරණි ණයට ගත් බසින් කථාකරමින් සමස්ත ලෝක ඉතිහාසයේ නව ජවනිකාවක් රඟපෑම සඳහා ඔවුන්ගේ නම්ද යුද්ධමය සටන් පාඨද ඇඳුම්ද ලබා ගනිති"

එදා ජේ.ආර්. ආරිය සිංහල සූට් එක ඇඳගෙන "මට කරන්න බැරි ගැහැනියක් පිරිමියෙක් කරන එකයි පිරිමියෙක් ගැහැනියක් කරන එකයි" යනුවෙන් ජනතාවට හෙණ දේශපාලන තගක් දැම්මේය. දැන් ජේ.ආර්.ගේ බෑණාද මාමාගේ පැරණි වෙස්මුහුණ බැඳගෙන ඔහුගෙන් ණයට ගත් බසින් මිය ගිය මාමාගේ ආත්මයට තමාගේ ආධාරයට එන ලෙස බියසුලු ලෙස පරණ මන්ත්‍ර ජපකරමින් එදා ඓතිහාසික ඛේදවාචකයක් වූ මාමාගේ භූමිකාව අද හාස්‍යමය භූමිකාවක් බවට මෙම බෑණා විසින් පත්කරනු ලැබ ඇත.

අද ජේ.ආර්.ව සිහිකරන්නට බලු කපුටෙක්වත් නැත. සිහිකළත් සිහි කරන්නේ මහත් පිළිකුලෙනි. ජනතා බලය ඉදිරියේ ජේ.ආර්.ගේ 5/6ක බලය කුජීත වී ගියේය. ලෝ ජනයාගේ දැවැන්ත අරගලය මැද හිට්ලර්ගේ මළකඳවත් සොයා ගැනීමට නොහැකිව අතුරුදහන් විය. නැග ආ ජනතා විරෝධය හමුවේ වියට්නාමයේ රුදුරු පාලකයා වූ ඩින්ඩියම්ගේ පපුව හරහා ඔහුගේම හමුදාව විසින් වෙඩි උණ්ඩ වර්ෂාවක් යැව්වේය. ජනතා අරගල ඉදිරියේ ඉඩි අමීන්, බොකාසා වැනි නරුම පාලකයන් උන්හිටි තැනුත් අහිමි වී ඒ උපන් රටේවත් ඉන්නට බැරිවී අසූචි, මළමූත්‍ර තරමට ජනතාවගේ පිළිකුලට ලක්වී මොලොවින් චුතවී ගියේය. ඉදින් රනිල් ඔබ මොන විගඩමක්ද? ඔබ කොමඩියක් පමණි. පුළුවන් නම් මාක්ස් ලියූ 'ප්‍රංශයේ සිවිල් යුද්ධය' පොත සොයාගෙන ඉහත පරිච්ඡේදයවත් කියවා තේරුම් ගන්න උත්සාහ දරන්න.

# පල්දෝරු මහින්ද

"විදෙස්, අත පෙවීම් මේ රටේ ආර්ථිකයට බරපතළ හානි කළා."

"සංවිධානාත්මක පිරිසක් රටේ ආර්ථිකය වැට්ටුවා"

"ජාතික සම්පත් විකුණනවා නම් අපෙනුත් අහන්න"

මේ මෙවර අයවැය විවාදයේදී විශේෂ ප්‍රකාශයක් කළ මහින්ද රාජපක්ෂ පළකළ අදහස් කිහිපයකි.

මේ එක් එක් ප්‍රකාශය ගැන නොනවතින හාස්‍යයක් මෙන්ම ප්‍රශ්න ගණනාවක්ද පැන නගී.

මහලු වියට යන විට බොහෝ දෙනාට 'ඩිමෙන්ෂියා' නම් රෝගී තත්වයක් ඇති වන බව වෛද්‍ය විද්‍යාව විසින් සොයාගෙන ඇත. එහිදී ඉතාම ආසන්න සිදුවීම් පවා විශ්මය ජනක ලෙස අමතක වන බව වෛද්‍යවරු පවසති. සමහරුන් මේ රෝගය උත්සන්න වූ විට නිරුවතින් පිස්සු කෙළින අවස්ථාද තිබෙන බව ඔවුහු පවසති. නමුත් මහින්ද පාර්ලිමේන්තුව තුළ මෙවැනි දේවල් කියන්නේ, ජනතාව තවමත් දේශපාලනයේදී පිදුරු සහ පුන්නක්කු අනුභව කරන පිරිසක් ලෙස සිතාගෙන ඔවුන් ඇන්දීමටද නැතිනම් ඒවා කියන්නේ ඇඳ සිටින වේට්ටිය උස්සා මුහුණ වසා ගනිමින්දැයි අප දන්නේ නැත.

අපි ප්‍රශ්න කිහිපයක් අසමු.

දැන් තියෙන්නේ කාගේ ආණ්ඩුවක්ද? විදෙස් අතපෙවීම් වේගවත් සහ බහුල වූයේ කාගේ පාලන කාලයේදීද? වරායවල්, ගුවන් තොටුපොළවල්, ආර්ථික වටිනාකමෙන් ඉහළ නාගරික ඉඩම් ඇතුළු ජාතික සම්පත් විකුණා වැඩිපුරම හොරකම් කළේ කාගේ කාලයේද? සංවිධානාත්මක පිරිසක් ආර්ථිකය වැට්ටුවා කියන්නේ තමන් ඇතුළු තම පවුලේ කට්ටිය සහ සහචරයින් ගැනම නොවේද? ජාතික සම්පත් විකුණනවා නම්, අපෙනුත් අහන්න කියන්නේ මේ ඔබලාගේ ආණ්ඩුවක් නොවෙයිද? කවුද අපි කියන්නේ? විකුණූ සම්පතුත් ආපසු ගන්නවා කියමින් රටේ සම්පත් ලහඩුවත් නැතිව ශුද්ධ කළේ කවුද? විකුණනවා නම් අපෙනුත් අහන්න කියන්නේ විකුණුවාට කමක් නෑ කියන එක සහ අපිටත් ගාණක් එන විදිහට වැඩේ කරපිය කියන එක නොවයිද?




අපිට තිබෙන කනගාටුව නම් මෙවැනි මජර, චෞර, උන්මත්තක දේශපාලුවන්ට තවමත් රෙදි ඇඳගෙන ජනතාව ඉදිරියට අවුත් කිසිදු හිරිකිතයක් නැතිව ජනතාව නැවත නැවතත් ඇන්දීමට පරිසරය විවෘත වී තිබීම ගැනය. දිවි ඇතිතෙක් සිපිරිගෙයි ගත කළ යුතු නරුම දේශපාළුවන් නැවත බෞතීස්ම වී ඔටුනු පැළඳ ගැනීමට දරන අප්‍රසන්න වෙහෙස ගැනය.

# වසරක් කෙටියෙන්




- රට බේරාගත් සාටක විරුවා ජනතා විරෝධය හමුවේ බංකර් ගත විය.
- රට ගොඩ නැගීමට ආ 'නාටක විරුවා ජනතාව විසින් ඇඩ්‍රසුත් නැතිකර දැමනු ලැබිණි.
- රාජපක්ෂ ප්‍රමුඛ පවුල සහ පවුලේ පාලනයේ අත්තිවාරම් දෙදරා පුපුරා ගියේය.
- මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ කල්ලිය අතට අසුවන සෑම දෙයක්ම සොරාකා රට හිඟමනට ඇද දැමූහ.
- විදෙස් අත පෙවීම්වලට යටවී ශ්‍රී ලාංකේය ජාතිය ලොව ඉදිරියේ නිවට, නියාලු, හිඟන තත්වයට ඇදදමා රටම මස්තබාල්දු කළේය.
- ණය බරින්, බදු බරින් ජනතාව චප්ප වී යන ආකාරයේ ආර්ථිකයක් ගොඩනැගුවේය.
- දුප්පත් අහිංසක ලෙඩ්ඩුන්ට දෙන බෙහෙත් පෙත්තෙන් පවා ගසා කෑවෝය.
- සීනි බදු වංචාවෙන්ද රටට තෙල් ගෙන්වීමේදී කරන මගඩිවලින්ද පවුලට කෝටි ප්‍රකෝටි ගණන් මුදල ඇදී එන මාර්ග විවෘත කර ගත්තෝය.
- තෙල් පෝලිම්, ගෑස් පෝලිම්වල ප්‍රථම වතාවට මිනිසුන් මැරී වැටෙන්න පටන් ගත්තේය. ඒ අතර රාජපක්ෂ පුතුන් ජල කරනම්, ගුවන් කරනම් ගසමින් විනෝද වූයේ රටම අපායක් තත්වයට ඇද දමමිනි.
- ජනතාව මහත්සේ පීඩාවට පත්වූ කොරෝනා ආපදාවේදී පවා ජනතා මුදල් ගසා කනු ලැබිණි.
- අයිතිකරුවන් නැති ඉඩම්, මැවෙන ඉඩම් සහ ගෙවල් ලොව පළමු වතාවට ලංකාවේ පහළ විය.
- අවසානයේ බුර බුරා නැගෙන ජනතා විරෝධය හමුවේ දුර්වල වී පජාත වී ගිය රාජපක්ෂ පවුල් පාලනය රැකීමට රාජපක්ෂලාගේම ආශිර්වාදය පිට ජනතා ද්‍රෝහී පිං ජනාධිපතිවරයෙක් ජනාධිපති පුටුවේ වාඩි කරවනු ලැබිණි.
- දැන් නරියා සිංහ හමක් පොරෝගෙන 'කිං බානට්' වී සිටී.

නොවැම්බර් 08

# මර්දනය යොදා ගත් පාලකයින්ට සිදු වූයේ ඉතිහාසයේ කුණුගොඩට වැටීමටයි

*(පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරමින්)*

## ජාතික ජන බලවේගය පාර්ලිමේන්තු කණ්ඩායම් නායක අනුර දිසානායක සහෝදරයා

**"රට තුළ මේ වන විට ඇතිවී තිබෙන ආර්ථික අර්බුදය හේතු කොට ගෙන නාගරික, අර්ධ නාගරික සහ වතු වැනි ක්ෂේත්‍රවල ජන කණ්ඩායම් ගණනාවක් ජීවත්වීමේ අතිශය දුෂ්කරතාවයට පත්ව සිටිති. උද්ධමනය 70% ඉක්මවා ඇති අතර භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් විශාල ලෙස ඉහළ ගොස් තිබේ.**

**දෛනික ආහාර අවශ්‍යතාව සපුරා ගත නොහැකි වතු ක්ෂේත්‍රය ප්‍රමුඛ කර ගත් ජනකොටස් අතර මන්දපෝෂණය උග්‍ර වෙමින් ඇති අතර දරුවන්ගේ පාසල් පැමිණීමටද එම තත්වය අතිශය අහිතකර ලෙස බලපා ඇත. පාන්පිටි ප්‍රධාන ආහාරයක් වී තිබෙන්නාවූද ආහාර පිසීම සඳහා භූමිතෙල් පාවිච්චි කරන්නාවූද ජන ප්‍රජාවට ඒවායේ මිල ගණන් ඉහළයාම හා හිඟය දැඩිව බලපායි. රජයේ රෝහල් හා බෙහෙත් ශාලාවන්හි ඖෂධ හිඟය මෙම ජනතාවගේ සෞඛ්‍ය තත්වයට දැඩි අවදානමක් ඇති කරවා තිබේ. මේ තත්වයන් වතුකර ජනතාව විශාල පීඩාවකට ලක්කර තිබෙන්නේ ඔවුන් ලබන දෛනික වැටුප ප්‍රමාණවත් නොවන බවට දුක්ගැනවිල්ලක් වසර ගණනාවක් පුරා නැගෙමින් තිබියෙදීය.**

**එසේම බැංකු පොලී අනුපතික ඉහළ යාම හේතුවෙන් පෞද්ගලික ණය ලබා ගත් ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයෝ හා විශ්‍රාමිකයෝ බරපතළ අසීරුතාවකට පත්ව සිටිති. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ණය පොලී වාරික, ලීසිං වාරික, විවිධ බදු, විදුලි බිල ඉහළ යාම හේතුවෙන්ද අමුද්‍රව්‍ය හිඟය, නිෂ්පාදනය කඩාවැටීම හා අලෙවිය සීමා වීම හේතුවෙන්ද සිටින්නේ දැඩි පීඩනයකය. පවතින ආර්ථික තත්වය තුළ ආදායම් මාර්ග අහිමි වීමේ ප්‍රතිඵලයක් ලෙස සමෘද්ධි වැනි සහනාධාර ලබන කාණ්ඩවලට තවත් සැලකිය යුතු පිරිසක් ඉක්මණින්ම අලුතින් ඇතුළත් විය යුතුව ඇත.**

**මෙම සමස්ත තත්වය බරපතළ ලෙස සැලකිල්ලට**



**ගනිමින් පීඩාවට පත් ජන කණ්ඩායම්වලට සහන සැලසීම සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුව ඇතැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමු."**

පුවත්පත්වලත්, මාධ්‍යවලත්, ජාත්‍යන්තර වශයෙනුත් අපේ ආර්ථිකයේ තිබෙන අර්බුදයන් පිළිබඳ දත්ත තොරතුරු ඉදිරිපත් වෙමින් තිබෙනවා. මේ සංඛ්‍යා දත්ත ඇතුලේත් මහපොළවේ තිබෙන සැබෑ තත්වය තුළත් ඇත්තේ ඉතාම භයානක තත්වයක්. ඒ තුළින් වුවත් පෙන්නුම් කරන්නේ මාරාන්තික තත්වයක්. ජනතාවගේ ජනජීවිතය විශාල පීඩාවකට පත්වී තිබෙනවා. යුනිසෙෆ් ආයතනය විසින් ඉදිරිපත් කර තිබෙන වාර්තාවක අපේ රටේ ලක්ෂ 57ක පුද්ගලයන් මානුෂීය ආධාර අපේක්ෂාවෙන් ජීවත්වෙන තත්වයක් තිබෙනවා. දෛනිකව ප්‍රමාණවත් ආහාර වේලක් ලබාගන්න ලක්ෂ 57ක ජනතාව අසමත් වී තිබෙනවා. මේ අය අතර ළමුන් ලක්ෂ 23ක් සිටිනවා. ඔවුන්ට නිසි පෝෂණ සහිත ආහාර වේලක් ලබාදීමේ නොහැකියාව උදාවී තිබෙනවා. ගැබිණි මව්වරුන්ට නිසි ආහාර වේලක් නැහැ. දරුවන් මන්දපෝෂණයෙන් පෙළනවා. ආහාර හිඟකමත්, බස් ගාස්තු ඉහළයාමත් නිසා පාසල් නොපැමිණීමේ තත්වයක් උදාවෙලා. මේ තත්වය වතුකරයේ උග්‍ර වෙලා තිබෙනවා. බර අඩු උපත් සංඛ්‍යාව 12.2%යි. මේ තත්වය වතුකරයේ 20%ක් වෙනවා. ළමුන් 7.4%ක් කෘෂභාවයෙන් පෙළෙනවා. අපේ රටේ එකට ජීවත් වෙන, ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙන වතුකරයේ ජනතාව ජාතික වශයෙන් ඇතිවෙන පීඩනයට වඩා දැඩි පීඩනයකට ලක්වී සිටිනවා. අපි මේ තත්වය ගැන අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

අද අත්‍යවශ්‍ය ඖෂධ විශාල ප්‍රමාණයක හිඟ තත්වයක් ඇතිවී තිබෙනවා. ප්‍රතිජීවක එන්නත් නැහැ. මළබද්ධය සඳහා ලබාදෙන සිරප්, හදිසි හෘදයාබාධ සඳහා ලබාදෙන පීටීඑන් එන්නත, ඕපීඩී එකෙන් වේදනාව සඳහා ලබාදෙන බාම් එක නැහැ. හදන්න අමු ද්‍රව්‍ය නැහැ. කැනියුලා එක අලවන ප්ලාස්ටර් එක නැහැ. ඔක්සිජන් හිඟතාවයක් මතුවී තිබෙනවා. අවශ්‍ය බෙහෙත් රෝහලේ නැතිවෙනවා වගේම ෆාමසියෙන් ගන්නා බෙහෙත් විශාල ලෙස මිල ඉහළ යාමක් තිබෙනවා.

ජනතාව විශාල පීඩනයකට ඇද වැටී තිබෙන මොහොතක ජනතාව කෙරෙහි සහකම්පනයක් නැති ජනාධිපති, රජිනගේ මළ ගෙදර යනවා, ලෝක පරිසර පද්ධතිය ගැන කතාකරන්න ඊජිප්තු යනවා. ජනතාව පත්වී ඇති තත්වය ගැන හැඟීමක් දැනීමක් තිබෙනවා නම්, ඒ පිළිබඳව මේ නායකයෝ සැලකිලිමත් විය යුතුව තිබෙනවා.

අද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කඩා වැටෙමින් තිබෙනවා. ඇඹිලිපිටියේ කර්මාන්ත ශාලාවක සේවකයන් 850 දෙනෙක් සේවය කළා. එයින් 275ක් ඉවත් කළා. ලොරි 64ක් දිවුවා. අද ලොරි 24යි දුවන්නේ. 40කට ආසන්න ප්‍රමාණයක් කොටළුඩ තබා තිබෙනවා. මේ කඩා වැටීම හේතුකොට ගෙන රැකියා විශාල වශයෙන් අහිමි වී තිබෙනවා. ව්‍යාපාරිකයන්ට ඒවා අත්හැරීමට සිදුවී තිබෙනවා. පොලී අනුපාතිකය 33%කට ගියා. බිස්කට් කර්මාන්තයේ 1/5ක් යි කෙරෙන්නේ. මුළු කුකුල් කර්මාන්තයම කඩා වැටිලා. ලංකාවේ ප්‍රධාන ඉදිකිරීම් සමගම් 05ක් වැසී තිබෙනවා. විශාල ප්‍රමාණයකට රැකියා අහිමි වී තිබෙනවා. මේ වන විට රැකියා දසදහසක් අහිමි වෙමින් තිබෙනවා. ජනතාව බලාගෙන ඉන්නේ තමන්ගෙ බත්පත සරිකර ගන්නේ කොහොමද, දරුවන්ට උගන්වන්නේ කොහොමද, පාසල් යන්න බස් ගාස්තුව සොයා දෙන්නේ කොහොමද, පෝෂ්‍යදායී ආහාර වේලක් දෙන්නේ කොහොමද ලෙඩ වෙලා ඉන්න අම්මා තාත්තට බෙහෙත් ටිකක් දෙන්නේ කොහොමද කියලා. ජනතාව අවශ්‍ය තම ජනජීවිතය සමග ගැට ගැසී තිබෙන ප්‍රශ්නවලට ඉක්මන් හෝ සාධාරණ පිළිතුරක්.

පුද්ගලික පරිහරණය වෙනුවෙන්, ව්‍යාපාරයක් වශයෙන් කෙනෙක් වාහන ගන්නවා. අද ඔහුට ඒවාට ලීසිං ගෙවා ගන්න, නඩත්තු කරන්න බැරිවෙලා තිබෙනවා. ලබන වැටුපට ගහන බදු වැඩිවෙලා තිබෙනවා. ත්‍රී වීල්, හා බස් රථ රියදුරන්, ඉදිකිරීම් කර්මාන්තයට භාණ්ඩ සැපයූ ලොරි රියදුරන් අපහසුතාවයට පත්වී තිබෙනවා. ඔවුන්ගේ වාහන පැහැර ගැනීමේ තත්වයක් උදාවෙලා තිබෙනවා. මේ නිසා ජීවත්වීමේ බරපතළ ගැටලුවලට වාහන හිමියන් මුහුණ දී තිබෙනවා. මේ පිළිබඳව අවධානය යොමු විය යුතුව තිබෙනවා.

> රජයකට සාධාරණ බදු අවශ්‍යයි. නමුත් ආර්ථිකය කඩා වට්ටලා, නිෂ්පාදන ආයතන කඩා වට්ටලා, ආහාර උද්ධමනය 95%ට ගෙනිහිල්ලා, ජනතාව බරපතළ ලෙස පීඩාවට පත්වී සිටින මොහොතක ඔවුන් පීඩාවට පත්කරන්න බදු ගැසීම විශාල වරදක්. එපමණක් නොවෙයි. මෙය ස්වභාවික ව්‍යසනයක් නොවෙයි. මේ රට කඩා වට්ටන්න කටයුතු කළ කබ්රාල්ලා, බැසිල්ලා නිදැල්ලේ සිටියදී ජනතාවට තවදුරටත් පීඩාවට පත්කිරීම ඉතාමත් අසාධාරණයි.

උපයන විට ගෙවන බද්දක් හඳුන්වා දී තිබෙනවා. මේ නිසා මෙතෙක් රුපියල් 600ක් ගෙවූ බද්ද රුපියල් 21,000ක් ගෙවන්න වෙනවා. මෙතෙක් රුපියල් 80,000ක් ගෙවූ බද්ද රුපියල් 286,000ක් ගෙවන්න සිදුවෙනවා. මේ රටේ වෘත්තීමය ක්ෂේත්‍රයේ 15%ක් වූ ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෛද්‍ය ක්ෂේත්‍රයේ, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ මේ වෘත්තීමය ක්ෂේත්‍රයේ අයට විශාල බද්දක් ගෙවන්න සිදුවී තිබෙනවා.

රජයකට සාධාරණ බදු අවශ්‍යයි. නමුත් ආර්ථිකය කඩා වට්ටලා, නිෂ්පාදන ආයතන කඩා වට්ටලා, ආහාර උද්ධමනය 95%ට ගෙනිහිල්ලා, ජනතාව බරපතළ ලෙස පීඩාවට පත්වී සිටින මොහොතක ඔවුන් පීඩාවට පත්කරන්න බදු ගැසීම විශාල වරදක්. එපමණක් නොවෙයි. මෙය ස්වභාවික ව්‍යසනයක් නොවෙයි. මේ රට කඩා වට්ටන්න කටයුතු කළ කබ්රාල්ලා, බැසිල්ලා නිදැල්ලේ සිටියදී ජනතාවට තවදුරටත් පීඩාවට පත්කිරීම ඉතාමත් අසාධාරණයි. මහ බැංකු බැඳුම්කර ගිවිසුම අවුරුදු 30ක එකක්. 2015 පෙබරවාරි මස නිකුත් කළේ. මේ නිසා සිදුවුණු අලාභය විශාලයි. බැංකු පොලී අනුපාතිකය 2%කින් ඉහළ ගියා. ණය ගන්න සෑම පුරවැසියෙක්ම 2%කට වඩා වාරික ගෙව්වා. මුළු ආර්ථික දේහයටම මෙය බලපෑවා. ඒ විතරක් නොවෙයි පොහොර ඇටයක්වත් නැතිව නැවකට මුදල් ගෙව්වා. ඒ වරදකරුවන්, සීනි බදු වංචාව කරපු අය, නිදැල්ලේ සිටියදී මේ රටේ ජනතාවගේ පඩිපතට බදු ගහනවා.

දැවැන්ත බුද්ධි ගලනයක් සිදුවෙමින් තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ හෝමෝන, දියවැඩියාව පිළිබඳ සිටි එකම වෛද්‍යවරයා, ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳව පරීක්ෂණ කළ එකම වෛද්‍යවරයා, සහ බැංකු ක්ෂේත්‍රයේ ඉහළ කළමනාකරුවන් 50%ක් පමණ රට අත හැර ගියා. රටක් හැටියට විශාල ඛේදවාචකයකට මුහුණ දී සිටින වෙලාවක්. සාමාන්‍යපෙළ සමත් නොවූ ලක්ෂයක් ශ්‍රම බලකායක් හැටියට බඳවා ගත්තා. පළමුවැනි කණ්ඩායම විදිහට 57,000ක් පමණ මේ වන විට බඳවාගෙන තිබෙනවා. මේ අයට අවුරුදු දෙකක් තිස්සේ වැටුප 22,000යි. අද මේ වැටුප පවුලක් නඩත්තුව සඳහා ප්‍රමාණවත්ද?

ජනතාව මුහුණ දී තිබෙන පීඩනයට පිළිතුරු ලබාදිය යුතුව තිබෙනවා. නමුත් පීඩාවට පත්වී සිටින ජනතාවට එරෙහිව මර්දනය දියත් කරමින් තිබෙනවා. අන්තරේ කැඳවුම්කරු හා ස්වාමීන් වහන්සේ මාස තුනක් රඳවාගෙන සිටීම සඳහා ඔහු කළ වරද මොකක්ද? ත්‍රස්ත ක්‍රියාව මොකක්ද? රඳවා ගැනීමේ නියෝගයට අත්සන ගහන්න පුළුවන් හිරි වැටුණු නායකයෙකුට විතරයි. එසේ කළ හැක්කේ වියරු මනසක් තිබුණු කෙනෙකුට විතරයි. හදවතේ තෙතමනයක් නැති, හැඟීම් දැනෙන්නේ නැති, දර කැල්ලක් වගේ වියළි මිනිස්සු අපේ රට පාලනය කරනවා. ඔහුට පුටුවත්, මේසයත්, දරුවත් එකයි. ලෝක ඉතිහාසයේ මර්දනය තමන්ගේ පැවැත්ම සඳහා යොදා ගත් හැම පාලකයෙක්ම කුණුගොඩට වැටී තිබෙනවා. මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරන්න ඕනෑ. මේ පනත යටතේ රඳවාගෙන සිටින අන්තරේ කැඳවුම්කරු සහ ස්වාමීන් වහන්සේ නිදහස් කරන්න ඕනෑ. මොවුන් රඳවාගෙන සිටින හේතුව කියන්න. තවදුරටත් ජනතා අයිතිවාසිකම්වලට එරෙහිව මර්දනය ක්‍රියාත්මක කිරීමෙන් ලෝකය ඉදිරියේ හුදකලා වෙනවා පමණක් නොවෙයි ඉතාමත් භයානක ඉරණමකට තල්ලු කරනවා. අපි රනිල් වික්‍රමසිංහටත් ආණ්ඩුවටත් අවධාරණයෙන් කියා සිටින්නේ එවැනි තත්වයකට නොයන ලෙසයි.

---

02 වැනි පිටුවෙන්

# බදුබර අහසට...

අපට වැරදුනේ කොතනද අප වරද්දාගත්තේ කොතනද? මේ කියන්නේ කවුද? මුලින්ම යෞවන කටයුතු ඇමති, තරුණ ඇමති, කර්මාන්ත ඇමති, හයපාරක් අගමැති, දැන් පිනට ජනාධිපති. රනිල් ජනතාවගෙන් අහනවා මොකද වුණේ කියලා. රනිල් ජීවිත කාලයේ වැඩිපුරම කාලා ඇත්තේ පාර්ලිමේන්තුවෙන්. ජීවත් වෙලා තියෙන්නේ ජනතා මුදල්වලින්. ඒ තරම් පාර්ලිමේන්තුවේ හිටියා. ඔය පාර්ලිමේන්තුවේ බහුතරයක් එහෙමයි. ඔවුන් අපෙන් අහනවා කාටද වැරදුනේ කියලා.

ජනප්‍රිය තීරණ නෙවෙයි නිවැරදි තීරණ ගන්න කියන රනිල් නෙවෙයිද බ්‍රේස්ලට් දෙන්න කතා කළේ. අගමැති විදියට ෆොක්ස්වැගන් කර්මාන්ත ශාලාවක් ගේනවා කියලා පොල් ගස් කපලා දැම්මා. කුඩේ යටින් යන අයට වාහනයක් දෙනවා කිව්වා. එහෙම කරපු අය දැන් කියනවා නිවැරදි තීරණ ගන්න ඕනෑලු. පළිඟු මැණිකේ සූරසේන ගෙනාපු ආර්ථිකය තමයි මේ තියෙන්නේ. ආණ්ඩුවෙන් ආණ්ඩුවට තමන්ට අනිත් එකාට වැඩියෙන් ණය ලැබෙනවා කියලා පාරම්බෑවේ නැද්ද? ණය ගැනීම අභිමානයක් විදියට හිතපු අය අද තමයි මේ කතාව කියන්නේ.

රනිල් කියනවා දූෂිතයින් හිරේ දානවා කියන එක ප්‍රවාදයක්ලු. රනිල් එහෙම කියන්නේ නැතුව ඒක යථාර්ථයක් කියන්නද? මහ බැංකුව කඩල විනාශ කරපු කෙනා වෙන මොනවා කියන්නද? දූෂිතයෙක් තවත් දූෂිතයෙක්ට දඬුවම් දෙන්නේ නැහැ කියලා අනුර සහෝදරයා නිතර කියනවා. අපි රනිල්ගෙන් හොරුන්ට දඬුවම් දීම බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ රටේ ජනතාව තවදුරටත් රවට්ටන්න බෑ. මේ ආර්ථිකය යටතේ කාටද ආරක්ෂාව සැලසුණේ. තමන්ගේ දරුවන් ආරක්ෂා කරගන්න අම්මලා තාත්තලා ඉස්කෝල ළඟ. කුඩුවලින් අයිස්වලින් තමන්ගේ දරුවන් බේරගන්න බෑ. දැන් ත්‍රෛලෝක විජය පත්‍ර ගැන කතා කරනවා. ඕක ආවොත් දේශපාලකයෝ බිස්නස් එක පටන් ගන්නවා. හොඳම උදාහරණය මේ රටේ වැඩිම බාර් පර්මිට් තියෙන්නේ දේශපාලකයින්ට.

රනිල් ලබන අවුරුද්දට ඉදිරිපත් කරන අයවැයෙන් කියන්නේ 2048 කියන දේවල්. ලබන අවුරුද්දේ කරන දේවල් ගැන මොකුත් කතාවක් නැහැ. කරන්න තියෙන්නේ ණය ගන්නවා. නැත්තන් සල්ලි අච්චු ගහනවා. ඒත් නැත්නම් දේශීය බැංකුවල සල්ලි ටික ගන්නවා. ලෙඩා මලත් බඩ සුද්දයි කියලා ඉන්නවා. ඒ නිසා මේක වෙනස් කරන්න ඕනෑ. මේ දූෂිත දේශපාලන ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලය විදියට අපි කතා කරන්නේ මේ අයවැය ගැන විතරක් නෙවෙයි. ජනතාව සමඟ මේ ආර්ථික කතා බහ අපි පටන් ගන්නවා. ජනතාව සමඟ මේ ගමන වෙනස් කරන ජවයට අපි එකතු වෙනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com



2022.11.13 - 33වැනි ඉල්මහ විරු සමරුව
කොළඹ විහාර මහා දේවි එළිමහන් රංග පීඨය

# ඉතිහාසය අපව නිදොස් කරමින් පවතිනවා



**ජාතික ජන බලවේගයේ නායක**
**අනුර දිසානායක සහෝදරයා**

මීට අවුරුදු 33කට පෙර අපේ පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු ආදරණීය සහෝදර සහෝදරියන් දස දහස් ගණනක් එක්සත් ජාතික පක්ෂයේ මිනීමරුවන් විසින් සදහටම උදුරාගනු ලැබුවා. අපට අද මෙතනට එක්රැස්වී සිටින්නේ ඔවුන්ගේ කැපකිරීම් ආදර්ශයට ගනිමින් ඔවුන් ප්‍රාර්ථනා කළ ලෝකය ගොඩනගා ගන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්නයි. ඉතා අසීරුතාවයකට පත්වූ අවස්ථාවලදී නැවත අපේ ජයග්‍රහණයන් පිළිබඳව සුබවාදී බලාපොරොත්තු ගෙන එන්නේ 87-89 කාලයේ අපෙන් උදුරාගත් වීරවරියන් සහ වීරවරුන්. එම යුගයේ ශ්‍රේෂ්ඨ කාර්යභාරය මොනතරම් නිවැරදිද යන්න අද නැවත නැවතත් තහවුරු වෙනවා. ඇත්ත ඉතිහාසය යටපත් කරන්න, විකෘති කරන්න බොහෝ සතුරන් ක්‍රියාකළා. නමුත් අපි කාටත් ඒ අරමුණු පිළිබඳව ගැඹුරු අවබෝධයක් තිබෙනවා. අද ඒ අවබෝධය තිබෙන්නේ අපට විතරක් නොවෙයි. අද සමාජයේ සාතිශය බහුතර පිරිසක් ඉදිරියට ඇවිත් කියන්නේ මේ සමාජය මුළුමලින්ම වෙනස් කළ යුතු බවයි. අද සියලුම තැන්වල සිටින ජනතාව කියන්නේ එදා ඔබ කී දේ හරි කියලයි. ඔබගේ ප්‍රතිපත්තිය, ඔබගේ හඬ නිවැරදි බව සියලුම අංශවල ජනතාව අද කියන්න පටන්ගෙන තිබෙනවා. ඉතිහාසය අපව නිදොස් කරමින් පවතිනවා. එය ජයග්‍රහණයේ දිසාව දෙසට අපි හරවන්න ඕනෑ.

කිසිදු යහපත් ප්‍රජාතාන්ත්‍රික සංශෝධනයක් මේ පාලකයන්ට ගේන්න බැහැ. ඔවුන්ට තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ හැකිළීමේ මාවතයි. ඒ නිසා මහජනතාවගේ දේපළ හොරකම් කිරීමට එරෙහි සටන, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන, ආර්ථික නිදහස අත්පත් කරගැනීමේ සටන මේ සියල්ල ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ සියලුම ප්‍රගතිශීලී සංවිධාන ඒකාබද්ධ වුණු මධ්‍යස්ථානයකින් දියත් කළ යුතුයි. ඒ වෙනුවෙන් ප්‍රධානම ජනතා මධ්‍යස්ථානය හැටියට ජාතික ජන බලවේගය ගොඩනගා තිබෙනවා. මහජන ව්‍යාපාරය වෙනුවට කල්ලි ගහන්න අපි කිසිසේත්ම සූදානම් නැති බව අවධාරණය කරනවා. මේ සම්බන්ධයෙන් සතුරා විශාල ලෙස කලබල වී සිටිනවා. මීට අවුරුදු දෙක තුනකට කලින් රාජපක්ෂ කඳවුර වෙනුවෙන් අපිට විරුද්ධව මුදාහැර තිබුණු අවලාද රනිල් වෙනුවෙන් දැන් මුදාහරිමින් තිබෙනවා. 1987-1989 විරුවන් අපිට පෙන්වා දී තිබෙන්නේ අවලාද පයට පෑගෙන දූවිල්ලක් තරම්වත් බලපාන්නේ නැති බවයි.

දේශපාලන පොරපිටිය තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ජාතික ජන බලවේගය කේන්ද්‍රගත කරගෙනයි. ලංකාවේ දශක ගණනාවකට පසු ඉතාමත් හොඳ අවස්ථාවක් නිර්මාණය වී තිබෙනවා. රාජපක්ෂ කඳවුර සුන්නත් දූලිවී ගිහින් කෙඳිරිගාන පිරිසක් ඉතිරිවී තිබෙනවා. දේශපාලනයේ ඇවිත් තිබෙන මේ විශේෂ අවස්ථාව ධෛර්යය සම්පන්නව මුහුණ දීමෙන් පොදු ජනතාව ඉල්ලා සිටින වෙනස සිදුකර ගැනීමට යොදාගත යුතුයි. මේ රටට තවදුරටත් අවශ්‍ය භාග ජයග්‍රහණ නොවෙයි. මීට වඩා දුෂ්කර කොන්දේසි යටතේ සතුරා සලිත වන ප්‍රබලතම ජනතා ව්‍යාපාරය 1988- 1989 කාලයේ ජනතා විමුක්ති පෙරමුණ විසින් ගොඩනැගුවා. ධෛර්යය සහ විශ්වාස, තමන් කරන කාර්යයට අවංකභාවය සහිතව අපි හැමදෙනාම මේ වෙලාවේ ජනතාව ජයග්‍රහණය කළ හැකි ව්‍යාපාරය නිසැක වශයෙන්ම ගොඩනැගිය හැකියි. ඒ වෙනුවෙන් සියලුම දෙනා ඒකරාශී වන ලෙස ආරාධනා කරනවා.

# ඉල්මහ විරුවන්ගේ බලාපොරොත්තු සැබෑ කරන සමාජයක් ඉක්මනින් ගොඩනගමු



**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්**
**ටිල්වින් සිල්වා සහෝදරයා**

1965 ජනතා විමුක්ති පෙරමුණ නිර්මාණය කරන අවස්ථාවේ ධනේශ්වර ක්‍රමය නියෝජනය කරන ප්‍රභූ පවුල් කිහිපයක් අතේ බලය තියාගෙන සිටියා. අපේ පංතියේ මිනිස්සු ඒ ප්‍රභූ පවුල්වල පක්ෂ තුළට ගොනුවෙලා සිටියා. එදා තිබුණු වමේ පක්ෂ අපේ පංතිය නියෝජනය කරන්න සමත් වුණේ නැහැ. ඒ නිසා මේ පක්ෂයෙ නිර්මාණය කරන්න රෝහණ විජේවීර සහෝදරයත් එක්ක අත්වැල් බැඳගත් පරම්පරාවක් මේ අවස්ථාවට සහභාගි වෙනවා. ඉන් පස්සේ 1970 අවසානයේ හිටපු විශාල පිරිසක් වගේම 1989 පස්සේ එකතු වුණු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගිවී සිටිනවා. 1989යේ අපට අහිමි කළ ප්‍රේමණීය සගයන් අපේක්ෂා කළ අරමුණු ජයග්‍රහණය කරවීමේ ගමනට එක්වී සිටින කැපකිරීම් කරන විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගී වී සිටිනවා.

1987-1989 ඉබේ පහළ වුණු එකක් නොවෙයි. ධනපති ආණ්ඩුව හිතාමතාම නිර්මාණය කළ එකක්. අපේ රට ආර්ථික වශයෙන්, දේශපාලන වශයෙන්, බිඳවට්ටා ඉන්දියාව හමුවේ දණින් වැටී පාවාදෙන කොට නිවටයින් ලෙස සිටිනවාට වටා සටන් කොට මිය යන්න සූදානම් කියන අධිෂ්ඨානයෙන් සටන් කළ සගයන් අපි සමරනවා. පරාධීන ලෙස ධනේශ්වර පාලනය තුළ සිටිනවා වෙනුවට අයුක්තිය අසාධාරණය ඉදිරියේ දණින් නොවැටී සටන් කළ යුතු බව කියාදුන් රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු පුරෝගාමී කණ්ඩායමක් අද අපි සමරනවා. සතුරා දෙපාරක් අවි බලයෙන් අපව විනාශ කළා. ජනතා විමුක්ති පෙරමුණ නැවත නැගී සිටීවි කියලා සතුරා විශ්වාස කළේ නැහැ. රංජන් විජේරත්නලා, ආර්. පේමදාසලා වහසි බස් දොඩලා තිබුණා. සතුරාගේ හීන බොඳ කරලා 1994 වෙනකොට දේශපාලනයට ඇතුල් වෙලා අද දක්වා පැමිණි ගමනක් තිබෙනවා.

ජනතා විමුක්ති පෙරමුණට මොකක් හරි කරලා බලය ගන්න උවමනාවක් නොවෙයි අපට තිබෙන්නේ. අපට ඕනෙ ආණ්ඩුවක් අටවන්න නොවෙයි. මහජනතාව බලයේ පංගුකාරයන් බවට පත්වෙන මහජනතාවගේ ආණ්ඩුවක් නිර්මාණය කිරීමයි. ඒ ආණ්ඩුව හදන්නෙත් මහජනතාව, ඒ ආණ්ඩුව රකින්නෙත් මහජනතාව. මහජනතාව හදන, මහජනතාව රකින ආණ්ඩුවක් එක්ක හැප්පෙන්න පුළුවන් ජගතෙක් ලෝකයේ බිහිවෙලා නැහැ. අපි එවැනි ආණ්ඩුවක් හදමු. ඒ මහජනතාව එක්ක එකතුවෙලා රට හදමු. වසර 74ක් විවිධ දේශපාලන පක්ෂවලට ඡන්දය දීලා කළකිරුණු ජනතාව අපි දිනාගන්න ඕනෑ. සතුරන් වෙනුවට මිතුරන් දිනාග න්න, කලින් මොන පක්ෂයේ සිටියත් පීඩාවට පත්වුණු මිනිසුන් දිනාගන්න, කලින් රැවටීමට ලක්වූ මිනිසුන් දිනාග ැනීමේ ව්‍යායාමය තවත් ධෛර්යයෙන් ඉදිරියට ගෙන යා යුතුයි. ජනවරමක් නැති ජනාධිපති සහ ආණ්ඩුව ඡන්දය කල්දාන්න ගෙනයන උපක්‍රමයට අපි අභියෝග කරන්න ඕනෑ. මාර්තු මාසයේ ඡන්දය නොතිබ්බොත් මේ රටේ මහජනතාව තමන්ගේ අයිතිය ලබාගන්න ආපහු මහපාරට එනවා. සංවිධානාත්මක දේශපාලන ව්‍යාපාරයක නායකත්වයෙන් ඒ ජනතාව ජයග්‍රහණය කරා යනවා. පසුගිය සටන්වල සිටි අවංක සියලු දෙනා අපි එකතු කරමු. අත්දැකීම් ලබාගමු. සතුරන් හරියට තේරුම් ගනිමු. කඩාකප්පල්කාරීන් හඳුනා ගනිමු. ප්‍රගතිශීලී බලවේග සියල්ල එකතු කර රනිල්ලා, රාජපක්ෂලා ඇතුළු ධනපති ක්‍රමය ඉවත් කර, අපේ දෑත්වලින් මේ රට ගොඩනගමු. අපේ විරු සගයන් හදවතින් අපේක්ෂා කළ, රට ගොඩනගමු.




## විදෙස් ඉල් මහ විරු සමරු...



කතානියා - ඉතාලිය



මෙසිනා - ඉතාලිය



ගෝතම්බර්ග් - ස්වීඩනය



පැරිසිය - ප්‍රංශය



සිඩ්නි - ඕස්ට්‍රේලියාව



බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්වරිය හමුවී...



වියට්නාම් කොමියුනිස්ට් පක්ෂය හමුවී...

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.